# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2009/8 - 2017 මාර්තු මස 07 වැනි අඟහරුවාදා - 2017.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 13/2013 (නියෝග)

**2013 අංක 1 දරන සමෘද්ධි පනත**

2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 42 වන වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

එස්. බී. දිසානායක,<br>
සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍ය.

2017 මාර්තු මස 06 වැනි දින,<br>
කොළඹදී ය.

නියෝග

1. මේ නියෝග 2017 අංක 1 දරන සමෘද්ධි නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග මගින් -

(අ) සමෘද්ධි ප්‍රතිලාභීන් තෝරාගැනීම සම්බන්ධයෙන් වූ නිර්ණායක ;
(ආ) සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන, සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයෙහි ව්‍යවස්ථා සහ පරිපාලන ව්‍යුහයන් හා ඒවායේ පළමුවන මහා සභා රැස්වීම්වලට අදාළ විධිවිධාන ;
(ඇ) සමෘද්ධි වැඩසටහන සඳහා පොදු ලාංඡනය ; සහ
(ඈ) සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන, සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයෙහි කර්තව්‍යය ඉටු කිරීමේ දී පැන නැගිය හැකි ආරවුල් විසඳීම සඳහා වන ක්‍රියා පටිපාටිය,

නිශ්චිතව දක්වනු ලැබේ.

3. (1) (අ) මේ නියෝග ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, පනතේ 44 (උ) වගන්තියේ විධිවිධානවලට අනුව යම් සුබසාධන ප්‍රතිලාභයක් ලැබීම සඳහා හිමිකම් ලැබ සිටින හෝ යම් සුබසාධන ප්‍රතිලාභයක් ලබන සෑම තැනැත්තෙක් ම හෝ පවුල් ඒකකයක් ම ;

(ආ) අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවා ඇති සමෘද්ධි දිස්ත්‍රික් කමිටුවේ උපදේශකවරයකු ලෙස කටයුතු කරනු ලබන, ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන සෑම තැනැත්තකු ම හෝ සෑම පවුල් ඒකකයක්ම ; සහ

(ඇ) අදාළ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා පිහිටුවා ඇති සමෘද්ධි දිස්ත්‍රික් කමිටුවේ උපදේශකවරයකු ලෙස කටයුතු කරනු ලබන එකී පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයාගේ නිර්දේශය මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන සෑම තැනැත්තකු ම හෝ සෑම පවුල් ඒකකයක් ම,

සමෘද්ධි ප්‍රතිලාභියකු ලෙස තෝරා ගනු ලැබිය යුතු අතර සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි සහනාධාර දීමනාව ලැබීමට හිමිකම් ලබන්නේ ය.

(2) දෙපාර්තමේන්තුවේ තාවකාලික හෝ ස්ථිර සේවා නියුක්තයකු වන යම් තැනැත්තකු හෝ දෙපාර්තමේන්තුවේ තාවකාලික හෝ ස්ථිර සේවා නියුක්තයකු ඇතුළත් වන පවුල් ඒකකයක් හෝ සමෘද්ධි ප්‍රතිලාභියකු ලෙස තෝරා ගැනීමට සුදුසුකම් නොලබන්නේ ය.

4. (1) (අ) සෑම සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක ම ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය ''අ'' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය ;

(ආ) සෑම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයක ම ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය ''ආ'' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය ;

(ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයේ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය ''ඇ'' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) (මෙහි මින්මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක්ම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයක්ම සහ (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමය, ඒ එක් එක් සංවිධානයට හෝ සංගමයට අනන්‍ය වූ තොරතුරු ඇතුළත් කර (1) වන ඡේදයේ සඳහන් කර ඇති අදාළ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සකස් කරන ලද, ඒ සංවිධානයේ හෝ සංගමයේ ව්‍යවස්ථාවේ සහ පරිපාලන ව්‍යුහයේ පිටපතක්, මේ නියෝගය පළකල දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දිය යුතු ය.

(3) (2) වන ඡේදයේ විධිවිධානවලට අනුකූලව ස්වකීය ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙන ලද සෑමසංවිධානයක් ම වෙත සහ සංගමය වෙත එම ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය ලැබුණු දිනයේ සිට දින හතළිස් පහක කාලසීමාවක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතිකයක් නිකුත් කළ යුතු ය.

5. (1) (අ) සෑම සංවිධානයක ම පළමුවන මහා සභා රැස්වීම, මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට මාස එකක කාල සීමාවක් ඇතුළත ; සහ

(ආ) සංගමයේ පළමුවන මහා සභා රැස්වීම, මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට මාස දෙකක කාලයක් ඇතුළත,

පවත්වනු ලැබිය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙනු ලබන දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් ඒ රැස්වීම් කැඳවීම සඳහා කටයුතු සැලැස්විය යුතු අතර, ඒ රැස්වීම්වල මුලසුන ද දැරිය යුතු ය. තවද, ඒ රැස්වීමේ දී පහත දැක්වෙන කටයුතු කරනු ලැබිය යුතු ය :-

(අ) අදාළ සංවිධානයේ හෝ සංගමයේ පළමුවන පාලක මණ්ඩලය, සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම ;

(ආ) සාමාජික ගාස්තුව නිශ්චය කරමින් යෝජනාවක් සම්මත කර ගැනීම ;

(ඇ) අදාළ සංවිධානයේ හෝ සංගමයේ ප්‍රධාන කාර්යාලය පිහිටන ස්ථානය නිශ්චය කරමින් යෝජනාවක් සම්මත කර ගැනීම ;

(ඈ) පාලක මණ්ඩලයේ පළමුවන රැස්වීම සඳහා දිනයක් නියම කර ගැනීම ; සහ

(ඉ) අදාළ සංවිධානයේ හෝ සංගමයේ කර්තව්‍යය ඉටු කිරීමට අවශ්‍ය විය හැකි වෙනත් යම් යෝජනා සම්මත කර ගැනීම.

6. (1) 4(3) වන නියෝගය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබූ යම් සංවිධානයක් හෝ සංගමය, 4(2) වන නියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙන ලද ස්වකීය ව්‍යවස්ථාව හා පරිපාලන ව්‍යුහය උල්ලංඝනය කරමින් කටයුතු කරන බව, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ම පෙනී යන අවස්ථාවක හෝ ඔහුට එම සංවිධානය හෝ සංගමය පිළිබඳ පැමිණිල්ලක් ලැබුණු අවස්ථාවක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලබන නිලධරයන් කණ්ඩායමක් මගින් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) (අ) (1) වන ඡේදය යටතේ පත් කරන ලද නිලධරයන් කණ්ඩායම විසින්, (1) වන ඡේදය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔවුන් වෙත යොමු කරන ලද කරුණු පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර පරීක්ෂණයේ දී ගන්නා ලද ප්‍රකාශ ද, පරීක්ෂණයේ දී පරීක්ෂාවට භාජනය කරන ලද අදාළ සියලු ලේඛනවල පිටපත් ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගත යුතු පියවර පිළිබඳ ඔවුන්ගේ නිර්දේශ ද ඇතුළත් කරමින් පරීක්ෂණයේ වාර්තාවක් පිළියෙල කළ යුතු ය.

(ආ) (අ) අනු-ඡේදය යටතේ වන පරීක්ෂණයක් අදාළ කරුණ පරීක්ෂණයට යොමු කරනු ලැබූ දිනයේ සිට මාස එකක කාලයක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

(3) පරීක්ෂණය පවත්වනු ලැබුවේ සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක සහ එම පරීක්ෂණය අවසානයේ, එම සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය 4(2) නියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහයේ විධිවිධාන උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි සනාථ වී ඇති අවස්ථාවක, ඒ සංවිධානය -

(අ) එහි පරමාර්ථ ඉෂ්ට වන ආකාරයට ක්‍රියාත්මක නොවන සංවිධානයක් බවට සලකනු ලැබිය යුතු අතර, පනතේ 14 වන වගන්තියේ විධිවිධාන යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගනු ලබන පියවරවලට යටත් විය යුතු ය ; සහ

(ආ) 4(3)නියෝගය යටතේ නිකුත් කරන ලද සහතිකය අවලංගු කරනු ලැබීමට යටත් කළ හැකි ය.

(4) (අ) පරීක්ෂණය පවත්වනු ලැබුවේ සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයක් හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමය සම්බන්ධයෙන් වන අවස්ථාවක සහ එම පරීක්ෂණය අවසානයේ, එම සංවිධානය හෝ සංගමය 4(2) නියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර දෙන ලද ව්‍යවස්ථාව හා පරිපාලන ව්‍යුහයේ විධිවිධාන උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයෙන් සනාථ වී ඇති අවස්ථාවක, එවැනි උල්ලංඝනය කිරීමකට හේතු පැහැදිලි කිරීම සඳහා අදාළ සංවිධානයේ හෝ සංගමයේ පාලක මණ්ඩලයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවස්ථාවක් ලබාදිය යුතු ය.

(ආ) අදාළ සංවිධානයට හෝ සංගමයට ඒ උල්ලංඝනය කිරීම සිදු කිරීම සඳහා සාධාරණ හේතු තිබූ බව සහ එම සංවිධානයට හෝ සංගමයට යථා පරිදි ක්‍රියාත්මක වීම සඳහා සහාය හෝ මාර්ගොපදේශ අවශ්‍ය බව, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු එම සංවිධානය හෝ මහා සංගමය වෙත අවශ්‍ය සහාය ලබා දීම හෝ මාර්ගෝපදේශ නිකුත් කිරීම කළ යුතු ය.

(ඇ) එවැනි උල්ලංඝනය කිරීමකට සාධාරණ හේතුවක් නොමැති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් -

(i) අදාළ සංවිධානයේ හෝ සංගමයේ එවකට සිටින පාලක මණ්ඩලය විසුරුවා හරිමින් නිවේදනයක් නිකුත් කිරීම ;

(ii) නව පාලක මණ්ඩලයක් පත් කරන තෙක්, එම සංවිධානය හෝ සංගමයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධරයන් තුන් දෙනෙකුට නොඅඩු හා පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත අතුරු පාලක මණ්ඩලයක් පත් කිරීම ;

(iii) අදාළ සංවිධානයට හෝ සංගමයට නව පාලක මණ්ඩලයක් පත්කිරීම සඳහා, ඔහුගේ නිවේදනයේ දින සිට දින හැටකට පසු නොවන කාලසීමාවක් තුළදී මහා සභා රැස්වීමක් පැවැත්වීම සඳහා අතුරු පාලක මණ්ඩලයට විධාන කිරීම ;

(iv) අවශ්‍ය වේ නම්, 4(3)නියෝගය යටතේ එම සංවිධානයකට හෝ සංගමයකට නිකුත් කරන ලද සහතිකය අවලංගු කර4(2) නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ සංවිධානයට හෝ සංගමයට නව ව්‍යවස්ථාවක් සහ පරිපාලන ව්‍යුහයක් ඉදිරිපත් කරන ලෙස නව පාලක මණ්ඩලයට විධාන කිරීම,

කළ හැකි ය.

7. 'ඇ' උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සෑම සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක සෑම සාමාජිකයකු වෙතම, සාමාජිකත්ව කාඩ්පතක් නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා පියවර ගත යුතු ය.

8. (1) (මෙහි මින්මතු ''සමෘද්ධි ලාංඡනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි 'ඉ' උපලේඛනයේ දක්වා ඇති ලාංඡනය සමෘද්ධි වැඩසටහනේ පොදු ලාංඡනය විය යුතු අතර, එය සමෘද්ධි වැඩසටහන යටතේ වන සෑම නිල ලේඛනයක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ දැන්වීමක ම භාවිත කරනු ලැබිය යුතු ය.

(2) සමෘද්ධි වැඩසටහන යටතේ කුමන හෝ කාර්යයක් සඳහා සමෘද්ධි ලාංඡනය භාවිත කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය.

(3) යම් බලය දෙනු නොලැබූ කාර්යයක් සඳහා සමෘද්ධි ලාංඡනය භාවිතා කරන ඕනෑම තැනැත්තෙක් පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

9. (1) පනත යටතේ වන ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී සංවිධානයක හෝ සංගමයේ සාමාජිකයන් අතර, ආරාවුලක් පැන නැගී ඇති අවස්ථාවක, අදාළ සංවිධානයේ හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ, එවැනි ආරාවුල් විසඳීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබ ඇති නිලධරයකු හෝ විමසා, ඒ ආරාවුල විසඳීමට පියවර ගත යුතු ය.

(2) අදාළ සංවිධානයේ හෝ සංගමයේ පාලක මණ්ඩලය විසින් එවැනි යම් ආරාවුලක් විසඳීම සඳහා ගනු ලැබූ පියවර පිළිබඳ ලිඛිත වාර්තාවක් තබා ගත යුතු අතර, ඒ අදාළ පියවර පිළිබඳ අදාළ පාර්ශ්වයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

10. (1) පනත යටතේ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ දී, සංවිධාන දෙකක් හෝ කීපයක් අතර ආරාවුලක් පැන නැගී ඇති අවස්ථාවක, ඒ සංවිධාන අතුරින් ඕනෑම එක සංවිධානයක පාලක මණ්ඩලය විසින්, ආරවුලේ අනෙක් පාර්ශ්වයන් පැමිණිල්ලේ දක්වමින්, ලිඛිත පැමිණිල්ලක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වහාම ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ පැමිණිල්ලක් කරනු ලැබුවේ යම් ආරාවුලක් සම්බන්ධයෙන් ද, ඒ ආරාවුල විසඳීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තුන් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකින් යුත් කමිටුවක් පත් කළ යුතු ය.

(3) (2) වන ඡේදය යටතේ පත් කරන ලද කමිටුවට දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඇතුළත් විය යුතු අතර, අදාළ ආරාවුලට පාර්ශ්වයක් නොවන සංවිධානවල පාලක මණ්ඩලවල සාමාජිකයන් අතුරින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් යම් සංඛ්‍යාවක් ඇතුළත් විය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ පත් කරන ලද කමිටුව විසින් එවැනි යම් ආරාවුලක් විසඳීමට ගනු ලැබූ පියවර පිළිබඳ ලිඛිත වාර්තාවක් තබා ගත යුතු අතර, ඒ පියවර පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ආරාවුලේ පාර්ශ්වයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

11. 9 වන හෝ 10 වන නියෝගය යටතේ ගනු ලැබූ පියවරවලින් අතෘප්තියට පත් යම් සංවිධානයකට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනා කළ හැකි ය.

12. (1) පනත යටතේ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ දී, සමෘද්ධි ප්‍රජා මූල බැංකු හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති දෙකක් හෝ කීපයක් අතර ආරාවුලක් පැන නැගී ඇති අවස්ථාවක, අදාළ බැංකු හෝ බැංකු සමිති අතුරින් යම් බැංකුවක හෝ බැංකු සමිතියක පාලක මණ්ඩලය විසින්, ආරාවුලේ අනෙක් පාර්ශ්වය හෝ පාර්ශ්වයන් පැමිණිල්ලේ සඳහන් කරමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වහාම ලිඛිත පැමිණිල්ලක් කළ යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ පැමිණිල්ලක් කරනු ලැබුවේ යම් ආරාවුලක් සම්බන්ධයෙන් ද, ඒ ආරාවුල විසඳීමේ කාර්යය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තුන් දෙනකුට නොඅඩු සාමාජිකයන් සංඛ්‍යාවකින් යුත් කමිටුවක් පත් කළ යුතු ය.

(3) (2) වන ඡේදය යටතේ පත් කරන ලද කමිටුවට දෙපාර්තමේන්තුවේ නිලධරයකු ඇතුළත් විය යුතු අතර, අදාළ ආරාවුලට පාර්ශ්වයක් නොවන බැංකුවල සහ බැංකු සමිතිවල පාලක මණ්ඩලවල සාමාජිකයන් අතුරින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් යම් සංඛ්‍යාවක් ඇතුළත් විය යුතු ය.

(4) (2) වන ඡේදය යටතේ පත් කරන ලද කමිටුව විසින් එවැනි යම් ආරාවුලක් විසඳීමට ගනු ලැබූ පියවර පිළිබඳ ලිඛිත වාර්තාවක් තබා ගත යුතු අතර, ඒ පියවර පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සහ ආරාවුලේ පාර්ශ්වයන් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

13. 12 වන නියෝගය යටතේ ගන්නා ලද පියවරවලින් අතෘප්තියට පත් යම් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක් හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක් විසින්, පනතේ 33 වන වගන්තිය යටතේ පත් කරන ලද සමෘද්ධි බැංකුවල සහ සමෘද්ධි බැංකු සමිතිවල කළමනාකරණ මණ්ඩල වෙත අභියාචනා කළ හැකි ය.

14. මෙම නියෝගවල, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"පනත" යන්නෙන් 2013 අංක 1 දරන සමෘද්ධි පනත අදහස් වේ ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් පනතේ 3 වන වගන්තිය යටතේ පත්කරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

''දෙපාර්තමේන්තුව'' යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව අදහස් වේ ;

"පාලක මණ්ඩලය" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි අදාළ ව්‍යවස්ථාවේ සහ පරිපාලන ව්‍යුහයේ නිශ්චිතව දක්වා ඇති අදාල සංවිධානයේ හෝ සංගමයේ විධායක සභාව, අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කළමනාකරණ මණ්ඩලය නැතහොත් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ කළමනාකරණ මණ්ඩලය හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ විධායක කමිටුව අදහස් වේ.

(4(1) (අ) නියෝගය)

"අ" උපලේඛනය

සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය

පූර්විකාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 2013 අංක 1 දරන සමෘද්ධි පනත ප්‍රකාරව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහිලා, තනි පුද්ගල වශයෙන්, පවුල, කණ්ඩායම් හා ප්‍රජාව මෙම පනතේ ප්‍රමුඛතා වන අතර, කලාප, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ජාලයේ මුල් ඒකකය ලෙසින් දිළිඳුබව තුරන් කිරීමේ හා සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ අතිමහත් පුළුල් වූ අභිමතාර්ථයට පණ පොවමින්, ජාතික අවශ්‍යතාව ඉටුකිරීමේ වගකීමට උරදීමේ දී, වැදගත් වූ ද, පුළුල් වූ ද අරමුණේ මූලාරම්භය මෙසේ සනිටුහන් කරන අතර, ජාතික, ආගමික හා දේශපාලනික භේද නොතකා, සියලු කටයුතු විවෘත හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම පිණිසබල ප්‍රදේශය තුළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම සංවිධානය ස්ථාපනය කරන අතර, සියලු සාමාජිකයන් වෙනුවෙන් නීතියේ සාධාරණත්වය හා නීතියේ සහාය සමානව උරුමකරදීම සඳහා, කාර්ය මණ්ඩලය හා සාමාජිකයන් සෑමවිටම සද්භාවයෙන් කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා ද, අරපිරිමැසුම්බව, නීතිගරුකබව, ආචාරශීලිබව, පරිසර හිතකාමීබව, ආත්ම විශ්වාසය, නිර්මාණශීලිබව හා සාමූහික වගකීම යන පුරුදු වැඩි දියුණු කර ගැනීම සඳහා ද, එකමුතුකම ඔස්සේ පක්ෂ දේශපාලනය මගින් භේදභින්න නොවූ ප්‍රජාවක් ලෙසින් ජාතික සමගිය තහවුරු කරමින් ප්‍රජාව එකමුතු කිරීම සඳහා ද, වටිනාකම් සොදාපාළුවට ලක්වීම වැළැක්වීම සඳහා මෙන්ම පවත්නා සම්පත් හා සේවාවලට සාධාරණ ප්‍රවේශයක් ලබාගැනීමට සියල්ලන්ට ම අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා මෙම සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය ස්ථාපනය කරනු ලැබේ.

01 වන පරිච්ඡේදය

මූලික කරුණු

1. නාමය : ................................................................ (බල ප්‍රදේශයේ නාමය) සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය

2. බල ප්‍රදේශය : (මෙහි මින්මතු "බල ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ..................................................... පළාතේ ................................. පරිපාලන දිස්ත්‍රික්කයේ ................................. ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ................................ (පළාත් පාලන ආයතනය) බල ප්‍රදේශය ඇතුළත ...................................................... බැංකුවේ ......................................................... (ග්‍රාම නිලධාරී කොට්ඨාසය) ...................................................... (ග්‍රාමය) සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය.

3. ලිපිනය : ....................................................................................................................

4. දැක්ම : "සවිබල ගැන්වූ සෞභාග්‍ය සම්පන්න ප්‍රජාවක්"

5. මෙහෙවර : කළමනාකරණ හා සන්නිවේදන කුසලතාවන්ගෙන් අනූන ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය කිරීම, දරිද්‍රතාවය තුරන් කිරීම හා ආර්ථික, සාමාජයීය හා සංස්කෘතිකමය සංවර්ධනය හා සමාජ සවිබල ගැන්වීම මගින් ප්‍රජාමූල බල ප්‍රදේශයේ ප්‍රජාව අතර උසස් ආකල්පමය සංවර්ධනයක් ස්ථාපනය කරමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා සෑම අංශයකින්ම දායක වීම.

6. අරමුණු, බලතල හා කර්තව්‍යය : (මෙහි මින්මතු "සංවිධානය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ................................. සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය, 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ පිළිවෙලින් 11 වන හා 12 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති බලතල හා කර්තව්‍යයන්, එම පනතේ 10 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට මෙයින් භාරගනු ලැබේ.

02 වන පරිච්ඡේදය

සාමාජිකත්වය

7. සාමාජිකත්වය සඳහා සුදුසුකම් :-

(1) බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය හිමි, සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුත් වැඩිහිටි සමෘද්ධි ප්‍රතිලාභියකු ......................................... සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(2) සංවිධානයේ සාමාජිකත්වය දැරීමට සුදුසුකම් ලබන තැනැත්තකු, අදාළ සාමාජිකත්වය සඳහා වන සාමාජිකත්ව ගාස්තු සමඟ අයදුම්පත ඉදිරිපත් කළ යුතු වේ. සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත මගින් අනුප්‍රාප්තිකයකු යෝජනා කළ යුතු ය.

(3) සියලුම සාමාජිකයන් මහා සභාව රැස්වීමක දී තීරණය කරනු ලබන මාසික සාමාජික ගාස්තුවක් ගෙවීමට බැඳී සිටි.

(4) සාමාජිකත්වය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට විධායක සභාවට හැකි ය. විධායක සභාවේ තීරණයකින් අතෘප්තියට පත්වන යම් සාමාජිකයකුට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

(5) විධායක සභාවේ ලේකම්වරයා විසින් සාමාජිකයන්ගේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

8. (1) පහත සඳහන් හේතූන් මත සාමාජිකත්වය අහෝසි විය යුතු ය :-

(i) සාමාජික ගාස්තු නොගෙවීම ;

(ii) දැනුම්දීමකින් තොරව, සංවිධානයේ අනුයාත රැස්වීම් තුනකට (3කට) නොපැමිණීම ;

(iii) සංවිධානයේ බල ප්‍රදේශය අත්හැර යාම ;

(iv) සාමාජිකත්වය දැරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය නොවීම ;

(v) සාමූහික ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී නොවන සහභාගීත්වය ;

(vi) අධිකරණයක් මගින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් වීම ;

(vii) ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම හෝ මියයාම.

(2) සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි වූ අවස්ථාවක අනුප්‍රාප්තිකයා විසින් සාමාජිකත්වය දැරිය යුතු ය.

## 03 වන පරිච්ඡේදය

## විධායක සභාව

9. (1) විධායක සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර මහ සභා රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කරගනු ලැබේ :

(i) සභාපතිවරයා;

(ii) උප සභාපතිවරයා;

(iii) ලේකම්වරයා;

(iv) සහකාර ලේකම්වරයා;

(v) භාණ්ඩාගාරික; සහ

(vi) තවත් සාමාජිකයන් ................................. දෙනකු. (හයකට නොඅඩු පහළොවකට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් නිශ්චිතව දැක්විය යුතු ය)

(2) අවම වශයෙන් සෑම මසක ම දෙවරක් විධායක සභාව රැස්විය යුතු ය.

(3) විධායක සභා රැස්වීමක ගණපූර්ණය සභිකයන් තිදෙනකු විය යුතු ය. විධායක සභාවේ බහුතර සමාජිකයන්ගේ ඉල්ලීම මත ඕනෑම අවස්ථාවක දී, ලේකම්වරයා විසින් රැස්වීමක් කැඳවිය හැකි ය.

(4) සභාපතිවරයා විධායක සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට නොපැමිණි විට, උප සභාපතිවරයා සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු ය. සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම නොපැමිණි විට රැස්වීමේ මුලසුන දැරීම සඳහා ලේකම්වරයා, සහකාර ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික අතරින් එක් සාමාජික තෝරා පත් කරගත යුතු ය.

(5) එක් පවුලකින් එක් තැනැත්තකු පමණක් විධායක සභාව නියෝජනය කළ යුතු ය.

(6) යම් සාමාජිකයකු දැනුම්දීමකින් තොරව අනුයාත විධායක සභා රැස්වීම් තුනකට නොපැමිණේ නම්, එම සාමාජිකයා විධායක සභා සාමාජිකත්වය දැරීමට නුසුදුස්සකු විය යුතු ය.

(7) විධායක සභා සාමාජිකයන් තෝරාගන්නා අවස්ථාවේ දී ම අභ්‍යන්තර විගණකවරයකු තෝරා පත් කළ යුතු ය. අභ්‍යන්තර විගණකවරයා විධායක සභාවේ සභිකයකු නොවිය යුතු ය.

(8) පළමු මහ සභා රැස්වීමේ දී සමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් වසරක කාල සීමාවක් සඳහා විධායක සභාවට සාමාජිකයන් තෝරා පත් කළ යුතු ය. නව විධායක සභාවක් හෝ විධායක සභා සාමාජිකයකු තෝරා පත් කරන ලද සෑම අවස්ථාවක දී ම (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතු ය.

(9) විධායක සභා සාමාජිකත්වය අවසන් වන යම් සමාජිකයකු නැවත පත්වීමක් ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(10) විධායක සභාවේ සෑම ඡන්ද විමසීමක් සාමාජිකයන්ගේ විවෘත ඡන්ද ප්‍රකාශ කිරීමෙන් පැවැත්විය යුතු ය.

(11) සුදුසු යැයි හැඟී යන අවස්ථාවක දී, විධායක සභාව විසින් රහස්‍ය ඡන්ද විමසීමක් පැවැත්විය හැකි ය.

**10. විධායක සභාවේ සමාජිකයන්ගේ බලතල හා කර්තව්‍යය.**

(1) සභාපතිවරයාගේ බලතල හා කර්තව්‍යයන් පහත පරිදි විය යුතු යඃ-

(i) සංවිධානයේ සෑම රැස්වීමක ම මුලසුන දැරීම, සභාපතිවරයා නොපැමිණි විට, උපසභාපතිවරයා රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, දෙදෙනාම නොපැමිණි විට රැස්වීමේ සිටින සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා වෙනත් සාමාජිකයකු තෝරා පත් කරගත යුතු යඃ

(ii) සෑම රැස්වීමකම සියලු කාර්ය සටහන් සහ වෙනත් වාර්තාවල සත්‍ය බව සහතික කිරීම;

(iii) සංවිධානයේ සියලු නිල කර්තව්‍යය සම්බන්ධයෙන් නිවේදන භාර ගැනීම;

(iv) සංවිධානය නියෝජනය කිරීම;

(v) සංවිධානයේ සියලු රැස්වීම් න්‍යාය පත්‍රය අනුව පැවැත්වීම;

(vi) ව්‍යවස්ථාවේ අරමුණුවල නිසි ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම;

(vii) සංවිධානයේ සංවර්ධනය හා මූල්‍ය ප්‍රවර්ධනය සලසවන්නා වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නායකත්වය සැපයීම;

(viii) සංවිධානයේ සාමාජිකයන් අතර සුහද සම්බන්ධතාව වැඩි දියුණු කිරීම සහ සාමාජිකයන්ගේ සක්‍රීයභාවය වැඩි දියුණු කිරීම;

(ix) අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යන බැංකු ගිණුම, භාණ්ඩාගාරිකගේ සහාය ඇතිව පවත්වාගෙන යාම.

(2) ලේකම්වරයාගේ බලතල හා කර්තව්‍යය පහත පරිදි විය යුතුයඃ-

(i) නියමිත දින දී මහා සභා රැස්වීම් හා විධායක කමිටු රැස්වීම් පිළිබඳ දැන්වීම් යැවීම;

(ii) වාර්තා හා ලිපිගොනු සුරක්ෂිතව පවත්වා ගැනීම;

(iii) දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් අනුව සංවිධානයේ ප්‍රගති වාර්තා සහ රැස්වීම්වල කාර්ය සටහන් වාර්තා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම;

(iv) සෑම රැස්වීමක ම කාර්ය සටහන් පිළියෙළ කිරීම;

(v) සංවිධානය වෙත යොමු කරනු ලබන සියලු ලිපිලේඛන පිළිගැනීම සහ එකී ලිපිලේඛන විධායක සභාවට යොමු කිරීම;

(vi) සංවිධානය විසින් යැවිය යුතු සියලු ලිඛිත නිවේදන හෝ විද්‍යුත් තැපැල් පණිවුඩ යැවීම;

(vii) සාමාජික ලේඛනය පවත්වාගෙන යාම;

(viii) සභාපතිවරයාගේ විධානවලට යටත්ව සංවිධානයේ ව්‍යවස්ථාව පිළියෙළ කිරීම හා එය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම;

(ix) සංවිධානයේ නිල මුද්‍රාව අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා එය සුරක්ෂිතව තැබීම

(3) භාණ්ඩාගාරිකගේ බලතල හා කර්තව්‍යය පහත පරිදි විය යුතු යඃ-

(i) සාමාජික ගාස්තු අයකර ගැනීම;

(ii) දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව අතැති මුදල් පවත්වාගෙන යාම;

(iii) අතැති මුදල් සඳහා වන බලයලත් සීමාව ඉක්මවන සියලු මුදල්, අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ තැන්පත් කිරීම;

(iv) සංවිධානයේ අයවැය පිළියෙළ කිරීම;

(v) මූල්‍ය ප්‍රවර්ධනය සඳහා පියවර ගැනීම;

(vi) සංවිධානයේ මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම;

(vii) සංවිධානයේ භෞතික සම්පත් සඳහා භාණ්ඩ ලේඛනයක් පවත්වාගෙන යාම;

(viii) සංවිධානයේ මූල්‍ය හා භෞතික සම්පත් විගණනය කිරීම සඳහා දෙපාර්මේන්තුවට සහාය වීම;

(ix) මූල්‍ය අංශයේ සියලු වාර්තා හා ලිපිලේඛන සඳහා සභාපතිවරයාගේ අත්සන ලබාගැනීම සහ ස්වකීය අත්සන තැබීම මගින් ඒවායේ සත්‍යබව සහතික කිරීම;

(x) අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යන ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයාට සහය වීම;

(xi) සංවිධානයේ ගිණුම් පවත්වාගෙන යාම සහ ගිණුම් පොත් තැබීම;

(xii) සංවිධානයේ අරමුදලට අදාළ සියලු ගිණුම් පොත් හා සියලු ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීම;

**04 වන පරිච්ඡේදය**

**රැස්වීම්**

**11. වාර්ෂික මහ සභා රැස්වීම. "**

සෑම ලිත් වර්ෂයක ම පළමු කාර්තුව තුළ විධායක සභාවේ විධාන මත ලේකම්වරයා විසින් වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු අතර, සෑම වාර්ෂික මහ සභා රැස්වීමක දී ම පහත සඳහන් කටයුතු සිදු කළ යුතු ය:

*(අ)* නව පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීම;
*(ආ)* පසුගිය වර්ෂයේ ගිණුම් සඳහා සාමාජිකයන්ගේ අනුමතිය ලබා ගැනීම;
*(ඇ)* පසුගිය වර්ෂයේ ප්‍රගති සමාලෝචන වාර්තාව සලකා බැලීම.

**12. විශේෂ මහා සභා රැස්වීම**

(1) සමාජිකයන්ගේ 1/4 කට නොඅඩු වූ සංඛ්‍යාවකගේ අත්සනින් මහා සභා රැස්වීමක් පැවැත්වීමට ලේකම්වරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ විට ලේකම්වරයා විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) විධායක සභාව විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමේ අවශ්‍යතාවක් ඇතැයි තීරණය කළ ඕනෑම අවස්ථාවක විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි ය.

**13. මාසික මහා සභා රැස්වීම**

(1) සෑම මාසයකටම වරක් සංවිධානයේ සාමාජිකයන් විසින් මහ සභා රැස්වීමක් පැවැත්විය යුතු අතර, අදාළ ප්‍රජාමූල බැංකුවෙන් ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සලකා බැලීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවෙන් සාමාජිකයන් ලබාගත් ණය නියාමනය කිරීම සහ එම නියාමන වාර්තා සැලකිල්ලට ගැනීම මෙම රැස්වීමේ දී විශේෂයෙන් ම සිදු කළ යුතු ය.

(2) වාර්ෂික මහ සභා රැස්වීමෙන් පසු පවත්වනු ලබන පළමු මාසික මහ සභා රැස්වීමේ දී ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කර සභා සම්මත කළ යුතු ය.

(3) භාණ්ඩාගාරික හෝ ඔහුගේ නියෝජිතයකු විසින් මාසික ආදායම් හා වියදම් වාර්තාවක් සෑම මාසික මහ සභා රැස්වීමක දී ම සභාගත කළ යුතු අතර, එය සලකා බැලීම සඳහා විසර්ජනයන් සම්මත කර වාර්තාගත කිරීම සහ චක්‍රීය අරමුදල සඳහා සැලකිය යුතු මුදල් ශේෂයක් රඳවා තබා ගැනීමෙන් පසුව, ඉතිරිවන ශේෂයක් සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ ගිණුමෙහි තැන්පත් කිරීම කළ යුතු ය.

**14. දැන්වීම්**

(1) ලේකම්වරයා විසින් සෑම රැස්වීමක් සඳහා ම සහභාගී වීමට සුදුසු සියලුම සභිකයන්ට අදාළ රැස්වීම් දිනයට දින 14කට පෙර රැස්වීම් සඳහා වන දැන්වීමක් සුදුසු පරිදි යැවීමට කටයුතු කළ යුතු ය:

එසේ වුව ද, විශේෂ මහ සභා රැස්වීම් සඳහා අවම වශයෙන් වැඩ කරන දින 5 කටවත් පෙරාතුව දැන්වීමක් යැවිය යුතු ය.

(2) හදිසි අවශ්‍යතාවන් හේතුවෙන් පවත්වන රැස්වීම් සම්බන්ධයෙන් වන විට, අදාළ සාමාජිකයා විසින් විධිමත්ව අවසන්වරට සපයා ඇති ජංගම දුරකථන අංකයට යවනු ලබන කෙටි පණිවුඩයක් මගින් හෝ අදාළ සාමාජිකයා විසින් විධිමත්ව විද්‍යුත් තැපැල් ලිපිනයක් සපයා ඇත්නම් එකී ලිපිනයට යවනු ලබන විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් අදාළ දැන්වීම යොමු කළ හැකි ය.

## 05 වන පරිච්ඡේදය

## මූල්‍ය කටයුතු

**15. සංවිධානයේ අරමුදල :-**

(1) සංවිධානයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට

*(අ)* සාමාජික ගාස්තු;
*(ආ)* අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන පරිත්‍යාග;
*(ඇ)* දෙපාර්තමේන්තුවේ විධාන අනුව සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා කොන්ත්‍රාත් හරහා උපයාගත් ආදායම්;
*(ඈ)* දෙපාර්තමේන්තු ප්‍රදාන;
*(ඉ)* ණය පොලී;
*(ඊ)* මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සංවිධානය සතු හෝ සංවිධානය නමින් යම් බැංකුවක තැන්පත් කර තිබු අරමුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) මෙම ප්‍රජා මූල සංවිධානයේ සියලු අරමුදල් අදාළ ප්‍රජා මූල බැංකුවේ පවත්වාගෙන යන ගිණුමක තැන්පත් කළ යුතු ය.

(4) සාමූහික මිලදී ගැනීම් හෝ ක්ෂණික ණය ව්‍යාපෘති වැනි විවිධාකාර ක්‍රමවේද හඳුන්වාදීම මගින් සාමාජිකයන්ගේ මූල්‍ය අවශ්‍යතාවයක් ඉටු කිරීම සඳහා සංවිධානයේ අරමුදල් යෙදවිය හැකිය.

(5) සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් සම්මත කරගත් යෝජනාවකට යටත්ව, ඉහත සඳහන් කරන ලද ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රියා පටිපාටීන් හා රීති, විධායක සභාව විසින් කලින් කල තීරණය කළ හැකි ය.

(6) සංවිධානයේ අරමුදල්, සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් යොදා ගත යුතු ය.

(7) සංවිධානයේ අරමුදල් පහත පරිදි උපයෝජනය කළ යුතු ය:-

(අ) මහා සභා රැස්වීමක දී සභා සම්මත කරගන්නා ලද විධායක සභාව විසින් සංවිධානය කරනු ලබන සංවිධානයේ බල ප්‍රදේශය තුළ, සංවිධානයේ සාමාජිකයන්ගේ සුභ සාධන ක්‍රියාකාරකම් සඳහා**;**
(ආ) සාමාජිකයන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් පැවැත්වීම සඳහා;
(ඇ) සංවිධානයේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාම සඳහා;
(ඈ) සංවිධානයට අවශ්‍ය වන උපකරණ හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා;
(ඉ) විධායක සභාව විසින් සංවිධානය සඳහා අවශ්‍ය වෙතැයි අනුමත කරන ලද යම් නීත්‍යානුකූල අයිතමයක් හෝ සේවාවක් මිලදී ගැනීම සඳහා;
(ඊ) පහත සඳහන් ප්‍රභේදයන් යටතේ සාමාජිකයන්ගේ මූල්‍ය අවශ්‍යතාවන් සඳහා ප්‍රජාමූල සංවිධානයට ආපදා ණය ප්‍රදානය කිරීම සිදු කළ හැකි ය**:**

(i) සාමාජිකයකුගේ හෝ ඔහුගේ යම් පවුලේ සාමාජිකයෙකුගේ අසනීපයකදී;
(ii) සාමාජිකයකුගේ හෝ ඔහුගේ යම් පවුලේ යම් සාමාජිකයකුගේ අභාවයකදී;
(iii) ස්වාභාවික ආපදාවක් හේතුවෙන් නිවාස හෝ දේපළ හානි සිදු වූ විට;
(iv) සාමාජිකයකු හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකු තාවකාලික ආබාධිත තත්ත්වයකට පත් වූ විට;
(v) විධායක සභාව විසින් අනුමත කරන ලද්දා වූ වෙනත් ඊට සමාන තත්ත්වයක්.

(8) සංවිධානය විසින් දෙනු ලබන ආපදා ණය සඳහා බලපැවැත්වෙන නියම හා කොන්දේසි, සමෘද්ධි පනතේ 33 වන වගන්තිය ප්‍රකාරව පත් කරනු ලැබූ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල හා සමෘද්ධි බැංකු සංගම්වල කළමනාකරණ මණ්ඩලයේ විධානවලට යටත්ව විධායක සභාව විසින් විධිමත්ව සකස් කළ යුතු ය.

16. මූල්‍ය කටයුතු අධීක්ෂණය

(අ) එහි බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සමෘද්ධිප්‍රජා මූල සංවිධානයන් හි අරමුදල් භාවිත කරමින් සිදු කෙරෙන සියලුම ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම; සහ

(ආ) එවැනි ක්‍රියාකාරකම්වලට අදාළව නිර්දේශයන් සිදු කිරීම සහ පනතේ 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමෘද්ධි දිස්ත්‍රික් කමිටු වෙත එම නිර්දේශ ඉදිරිපත් කිරීම, සංවිධානය විසින් සිදු කළ යුතු ය.

(4(1) (ආ) නියෝගය)

"ආ" උපලේඛනය

**සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ව්‍යවස්ථාව සහ පරිපාලන ව්‍යුහය**

**පූර්විකාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 2013 අංක 1 දරන සමෘද්ධි පනත ප්‍රකාරව ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහිලා, තනි පුද්ගල වශයෙන්, පවුල, කණ්ඩායම් හා ප්‍රජාව මෙම පනතේ ප්‍රමුඛතා වන අතර, කලාප, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ සම්බන්ධීකරණ ජාලයේ මූල් ඒකකය ලෙසින් දිළිඳු බව තුරන් කිරීමේ හා සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ අතිමහත් පුළුල් වූ අභිමතාර්ථයට පණ පොවමින්, ජාතික අවශ්‍යතාව ඉටුකිරීමේ වගකීමට උරදෙමින්, වැදගත් වූ ද, පුළුල් වූ ද අරමුණේ මූලාරම්භය මෙසේ සනිටුහන් කරන අතර, ජාතික, ආගමික හා දේශපාලනික භේද නොතකා, සියලු කටයුතු විවෘත හා විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම පිණිස බල ප්‍රදේශය තුළ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම සංවිධානය ස්ථාපනය කර ඇති අතර, සියලු සාමාජිකයන් වෙනුවෙන් නීතියේ සාධාරණත්වය හා නීතියේ සහාය සමානව උරුමකරදීම සඳහා, කාර්ය මණ්ඩලය හා සාමාජිකයන් සැමවිටම සද්භාවයෙන් කටයුතු කරන බව තහවුරු කිරීම සඳහා ද, අරපිරිමැසුම් බව, නීතිගරුක බව, ආචාරශීලී බව, පරිසර හිතකාමී බව, ආත්ම විශ්වාසය, නිර්මාණශීලී බව හා සාමූහික වගකීම යන පුරුදු වැඩි දියුණු කර ගැනීම සඳහා ද, එකමුතුකම ඔස්සේ පක්ෂ දේශපාලනය මගින් භේදභින්න නොවූ ප්‍රජාවක් ලෙසින් ජාතික සමගිය තහවුරු කරමින් ප්‍රජාව එකමුතු කිරීම සඳහා ද, වටිනාකම් සෝදාපාළුවට ලක්වීම වැළැක්වීම සඳහා මෙන්ම පවත්නා සම්පත් හා සේවාවලට සාධාරණ ප්‍රවේශයක් ලබාගැනීමට සියල්ලන්ට ම අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා මෙම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය ස්ථාපනය කරනු ලැබේ.

**01 වන පරිච්ඡේදය**

**මූලික කරුණු**

1. නාමය : ............................................................ (බල ප්‍රදේශය නියෝජනය වන නාමය) සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය

2. බල ප්‍රදේශය : (මෙහි මින්මතු "බල ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) ............................................ පළාතේ ............................................ පරිපාලන දිස්ත්‍රික්කයේ ............................................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................................ (පළාත් පාලන ආයතනය) බල ප්‍රදේශය ඇතුළත ...................................... සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමයේ (ග්‍රාම නිලධාරී කොට්ඨාසය) ...................................... (ග්‍රාමය) සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය.

3. ලිපිනය : ..............................................................................................................................................

4. දැක්ම : "සවිබල ගැන්වූ සෞභාග්‍ය සම්පන්න ප්‍රජාවක්"

5. මෙහෙවර : කළමනාකරණ හා සන්නිවේදන කුසලතාවන්ගෙන් අනූන ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය කිරීම, දරිද්‍රතාවය තුරන් කිරීම හා ආර්ථික, සාමාජයීය හා සංස්කෘතිකමය සංවර්ධනය හා සමාජ සවිබල ගැන්වීම මගින් ප්‍රජාමූල බල ප්‍රදේශයේ ප්‍රජාව අතර උසස් ආකල්පමය සංවර්ධනයක් ස්ථාපනය කරමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා සෑම අංශයකින්ම දායක වීම.

6. අරමුණු, බලතල හා කර්තව්‍යයන් : (මෙහි මින්මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ............................................ සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය, 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ පිළිවෙළින් 17 වන හා 18 වන වගන්තිවල නිශ්චිතව දක්වා ඇති බලතල හා කර්තව්‍යයන්, එම පනතේ 16 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට මෙයින් භාරගනු ලැබේ.

## 02 වන පරිච්ඡේදය

## සාමාජිකත්වය

7. (1) සංවිධානයේ සාමාජිකයන් පහත පරිදි විය යුතු ය :-

(අ) බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සියලු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරු ;
(ආ) ප්‍රදේශයක් භාර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියා ;
(ඇ) සමෘද්ධි පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති බල ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල ජ්‍යෙෂ්ඨ කළමණාකරුවන් ; සහ
(ඈ) ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල නිරත වන තැනැත්තන්ගෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන තිදෙනෙක්.

8. පහත සඳහන් හේතූන් මත සාමාජිකත්වය අහෝසි විය යුතු ය :-

(i) දැනුම්දීමකින් තොරව, සංවිධානයේ අනුයාත රැස්වීම් තුනකට (3) කට නොපැමිණීම ;
(ii) සංවිධානයේ බල ප්‍රදේශය අත්හැර යාම ;
(iii) සාමාජිකත්වය දැරීමට ශාරීරිකව සහ මානසිකව යෝග්‍ය නොවීම ;
(iv) සාමූහික ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී නොවන සහභාගීත්වය ;
(v) අධිකරණයක් මගින් පනවනු ලැබූ බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයකට යටත් වීම ;
(vi) ස්වේච්ඡාවෙන් ඉල්ලා අස්වීම හෝ මියයාම.

## 03 වන පරිච්ඡේදය

## විධායක සභාව

9. (1) විධායක සභාව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු අතර මහා සභා රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තෝරා පත් කරගත යුතු ය :-

(i) සභාපතිවරයා ;
(ii) උප සභාපතිවරයා ;
(iii) ලේකම්වරයා ;
(iv) සහකාර ලේකම්වරයා ;
(v) භාණ්ඩාගාරික ; සහ
(vi) තවත් සාමාජිකයන් ..................... දෙනකු. (හයකට නොඅඩු පහළොවකට නොවැඩි සාමාජිකයන් සංඛ්‍යාවක් නිශ්චිතව දැක්විය යුතු ය)

(2) අවම වශයෙන් සෑම මසකටම දෙවරක් විධායක සභාව රැස්විය යුතු ය.

(3) විධායක සභා රැස්වීමක ගණපූර්ණය සභිකයන් තිදෙනකු විය යුතු ය. විධායක සභාවේ බහුතර සාමාජිකයන්ගේ ඉල්ලීම මත ඕනෑම අවස්ථාවක දී, ලේකම්වරයා විසින් රැස්වීමක් කැඳවිය හැකි ය.

(4) සභාපතිවරයා විධායක සභාවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට නොපැමිණි විට, උප සභාපතිවරයා සභාපතිවරයා ලෙස කටයුතු කළ යුතු ය. සභාපතිවරයා සහ උප සභාපතිවරයා යන දෙදෙනාම නොපැමිණි විට රැස්වීමේ මුලසුන දැරීම සඳහා ලේකම්වරයා, සහකාර ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික අතරින් එක් තැනැත්තකු තෝරා පත් කරගත යුතු ය.

(5) එක් පවුලකින් එක් තැනැත්තකු පමණක් විධායක සභාව නියෝජනය කළ යුතු ය.

(6) යම් සාමාජිකයකු දැනුම්දීමකින් තොරව අනුයාත විධායක සභා රැස්වීම් තුනකට නොපැමිණේ නම්, එම සාමාජිකයා විධායක සභා සාමාජිකත්වය දැරීමට නුසුදුස්සකු විය යුතු ය.

(7) විධායක සභාවේ සාමාජිකයන් තෝරාගන්නා අවස්ථාවේ දී ම අභ්‍යන්තර විගණකවරයකු තෝරා පත් කළ යුතු ය. අභ්‍යන්තර විගණකවරයා විධායක සභාවේ සභිකයකු නොවිය යුතු ය.

(8) පළමු මහ සභා රැස්වීමේ දී සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් වසරක කාල සීමාවක් සඳහා විධායක සභාවට සාමාජිකයන් තෝරා පත් කළ යුතු ය. නව විධායක සභාවක් හෝ විධායක සභා සාමාජිකයකු තෝරා පත් කරන ලද සෑම අවස්ථාවකදී ම (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දිය යුතු ය.

(9) විධායක සභා සාමාජිකත්වය අවසන් වන යම් සාමාජිකයකු නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(10) විධායක සභාවේ සෑම ඡන්ද විමසීමක් ද සාමාජිකයන්ගේ විවෘත ඡන්ද ප්‍රකාශ කිරීමෙන් පැවැත්විය යුතු ය.

(11) සුදුසු යැයි හැඟී යන අවස්ථාවක දී, විධායක සභාව විසින් රහස්‍ය ඡන්ද විමසීමක් පැවැත්විය හැකි ය.

**10. විධායක සභා සාමාජිකයන්ගේ බලතල හා කර්තව්‍යයන්.**

(1) සභාපතිවරයාගේ බලතල හා කර්තව්‍යයන් පහත පරිදි විය යුතු යः-

(i) සංවිධානයේ සෑම රැස්වීමක ම මුලසුන දැරීම, සභාපතිවරයා නොපැමිණි විට, උපසභාපතිවරයා රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, දෙදෙනාම නොපැමිණි විට රැස්වීමේ සිටින සාමාජිකයන් විසින් රැස්වීමේ මුලසුන දැරීම සඳහා වෙනත් සාමාජිකයකු තෝරා පත් කරගත යුතු ය.

(ii) සෑම රැස්වීමකම සියලු කාර්ය සටහන් සහ වෙනත් වාර්තාවල සත්‍ය බව සහතික කිරීම ;

(iii) සංවිධානයේ සියලු නිල කර්තව්‍යය සම්බන්ධයෙන් නිවේදන භාර ගැනීම ;

(iv) සංවිධානය නියෝජනය කිරීම ;

(v) සංවිධානයේ සියලු රැස්වීම් න්‍යාය පත්‍රය අනුව පැවැත්වීම ;

(vi) ව්‍යවස්ථාවේ අරමුණුවල නිසි ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම ;

(vii) සංවිධානයේ සංවර්ධනය හා මූල්‍ය ප්‍රවර්ධනය සලසවන්නා වූ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නායකත්වය සැපයීම ;

(viii) සංවිධානයේ සාමාජිකයන් අතර සුහද සම්බන්ධතාව වැඩි දියුණු කිරීම සහ සාමාජිකයන්ගේ සක්‍රියභාවය වැඩි දියුණු කිරීම ;

(ix) අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යන බැංකු ගිණුම, භාණ්ඩාගාරිකගේ සහාය ඇතිව පවත්වාගෙන යාම.

(2) ලේකම්වරයාගේ බලතල හා කර්තව්‍යය පහත පරිදි විය යුතු ය ः-

(i) නියමිත දින දී මහා සභා රැස්වීම් හා විධායක කමිටු රැස්වීම් පිළිබඳ දැන්වීම් යැවීම ;

(ii) වාර්තා හා ලිපිගොනු සුරක්ෂිතව පවත්වා ගැනීම ;

(iii) දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවන් අනුව සංවිධානයේ ප්‍රගති වාර්තා සහ රැස්වීම් වල කාර්ය සටහන් වාර්තා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම ;

(iv) සෑම රැස්වීමක ම කාර්ය සටහන් පිළියෙළ කිරීම ;

(v) සංවිධානය වෙත යොමු කරනු ලබන සියලු ලිපිලේඛන පිළිගැනීම සහ එකී ලිපිලේඛන විධායක සභාවට යොමු කිරීම ;

(vi) සංවිධානය විසින් යැවිය යුතු සියලු ලිඛිත නිවේදන හෝ විද්‍යුත් තැපැල් පණිවුඩ යැවීම ;

(vii) සාමාජික ලේඛනය පවත්වාගෙන යාම ;

(viii) සභාපතිවරයාගේ මග විධානවලට යටත්ව සංවිධානයේ ව්‍යවස්ථාව පිළියෙළ කිරීම හා එය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ix) සංවිධානයේ නිල මුද්‍රාව අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සඳහා එය සුරක්ෂිතව තැබීම.

(3) භාණ්ඩාගාරිකගේ බලතල හා කර්තව්‍යය පහත පරිදි විය යුතු ය ः-

(i) සාමාජික ගාස්තු අයකර ගැනීම ;

(ii) දෙපාර්තමේන්තු නියෝග ප්‍රකාරව අතැති මුදල් පවත්වාගෙන යාම ;

(iii) අතැති මුදල් සඳහා වන බලයලත් සීමාව ඉක්මවන සියලු මුදල්, අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ තැන්පත් කිරීම ;

(iv) සංවිධානයේ අයවැය පිළියෙළ කිරීම ;

(v) මූල්‍ය ප්‍රවර්ධනය සඳහා පියවර ගැනීම ;

(vi) සංවිධානයේ මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය කිරීම සහ නඩත්තු කිරීම ;

(vii) සංවිධානයේ භෞතික සම්පත් සඳහා භාණ්ඩ ලේඛනයක් පවත්වාගෙන යාම ;

(viii) සංවිධානයේ මූල්‍ය හා භෞතික සම්පත් විගණනය කිරීම සඳහා දෙපාර්මේන්තුවට සහාය වීම ;

(ix) මූල්‍ය අංශයේ සියලු වාර්තා හා ලිපිලේඛන සඳහා සභාපතිවරයාගේ අත්සන ලබාගැනීම මගින් ඒවායේ සත්‍යබව සහතික කිරීම ;

(x) අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යන ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා සභාපතිවරයාට සහය වීම;

(xi) සංවිධානයේ ගිණුම් පවත්වාගෙන යාම සහ ගිණුම් පොත් තැබීම ;

(xii) සංවිධානයේ අරමුදලට අදාළ සියලු ගිණුම් පොත් හා සියලු ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීම ;

## 04 වන පරිච්ඡේදය

## රැස්වීම්

**11. වාර්ෂික මහ සභා රැස්වීම.**

සෑම ලිත් වර්ෂයක ම පළමු කාර්තුව තුළ විධායක සභාවේ විධාන මත ලේකම්වරයා විසින් වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු අතර, සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම පහත සඳහන් කටයුතු සිදු කළ යුතු ය.

(අ) නව පාලක මණ්ඩලය තෝරා පත් කර ගැනීම ;
(ආ) පසුගිය වර්ෂයේ ගිණුම් සඳහා සාමාජිකයන්ගේ අනුමතිය ලබා ගැනීම ;
(ඇ) පසුගිය වර්ෂයේ ප්‍රගති සමාලෝචන වාර්තාව සලකා බැලීම.

**12. විශේෂ මහා සභා රැස්වීම.**

(1) සාමාජිකයන්ගේ 1/4 කට නොඅඩු වූ සංඛ්‍යාවකගේ අත්සනින් මහා සභා රැස්වීමක් පැවැත්වීමට ලේකම්වරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ විට ලේකම්වරයා විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු ය.

(2) විධායක සභාව විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමේ අවශ්‍යතාවක් ඇතැයි තීරණය කළ ඕනෑම අවස්ථාවක විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකි ය.

**13. මාසික මහ සභා රැස්වීම.**

(1) සෑම මසකටම වරක් සංවිධානයේ සාමාජිකයන් විසින් මහ සභා රැස්වීමක් පැවැත්විය යුතු අතර, අදාළ ප්‍රජාමූල බැංකුවෙන් ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සලකා බැලීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවෙන් සාමාජිකයන් ලබාගත් ණය අධීක්ෂණය කිරීම සහ එම අධීක්ෂණ වාර්තා සැලකිල්ලට ගැනීම මෙම රැස්වීමේ දී විශේෂයෙන් ම සිදු කළ යුතු ය.

(2) වාර්ෂික මහ සභා රැස්වීමෙන් පසු පවත්වනු ලබන පළමු මාසික මහ සභා රැස්වීමේ දී ඉදිරි වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලසුම පිළියෙළ කර සභා සම්මත කළ යුතු ය.

(3) භාණ්ඩාගාරික හෝ ඔහුගේ නියෝජිතයකු විසින් මාසික ආදායම් හා වියදම් වාර්තාවක් සෑම මාසික මහ සභා රැස්වීමක දී ම සභාගත කළ යුතු අතර, එය සලකා බැලීම සඳහා විසර්ජනයන් සම්මත කර වාර්තාගත කිරීම සහ චක්‍රීය අරමුදල සඳහා සැලකිය යුතු මුදල් ශේෂය රඳවා තබා ගැනීමෙන් පසුව, ඉතිරිවන ශේෂය සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ ගිණුමෙහි තැන්පත් කිරීම කළ යුතු ය.

**14. දැන්වීම් ;**

(1) ලේකම්වරයා විසින් සෑම රැස්වීමක් සඳහා ම සහභාගී වීමට සුදුසු සියලුම සභිකයන්ට අදාළ රැස්වීම් දිනයට දින 14කට පෙර රැස්වීම් සඳහා වන දැන්වීමක් සුදුසු පරිදි යැවීමට කටයුතු කළ යුතු ය.

එසේ වුවද, විශේෂ මහ සභා රැස්වීම් සඳහා අවම වශයෙන් වැඩ කරන දින 5 කටවත් පෙරාතුව දැන්වීමක් යැවිය යුතු ය.

(2) හදිසි අවශ්‍යතාවන් හේතුවෙන් පවත්වන රැස්වීම් සම්බන්ධයෙන් වන විට, අදාළ සාමාජිකයා විසින් විධිමත්ව අවසන්වරට සපයා ඇති ජංගම දුරකථන අංකයට යවනු ලබන කෙටි පණිවුඩයක් මගින් හෝ අදාළ සාමාජිකයා විසින් විධිමත්ව විද්‍යුත් තැපැල් ලිපිනයක් සපයා ඇත්නම් එකී ලිපිනයට යවනු ලබන විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් අදාළ දැන්වීම යොමු කළ හැකි ය.

## 05 වන පරිච්ඡේදය

## මූල්‍ය කටයුතු

**15. සංවිධානයේ අරමුදල ඃ-**

(1) සංවිධානයට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට

(අ) සාමාජික ගාස්තු ;
(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන පරිත්‍යාග ;

(ඇ) දෙපාර්තමේන්තුවේ විධාන අනුව සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා කොන්ත්‍රාත් හරහා උපයාගත් ආදායම් ;
(ඈ) දෙපාර්තමේන්තු ප්‍රදාන ;
(ඉ) ණය පොලී ;
(ඊ) මෙම ව්‍යවස්ථාවට ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව සංවිධානය සතු හෝ සංවිධානය නමින් යම් බැංකුවක තැන්පත් කර තිබූ අරමුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) ප්‍රාදේශීය සංවිධානයේ සියලු අරමුදල් අදාළ සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ පවත්වාගෙන යන ගිණුමක තැන්පත් කළ යුතු ය.

(4) සංවිධානයේ අරමුදල්, සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් යොදා ගත යුතු ය.

**16. මූල්‍ය කටයුතු අධීක්ෂණය**

(අ) එහි බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක සමෘද්ධිප්‍රජා මූල සංවිධානයන් හි අරමුදල් භාවිත කරමින් සිදු කෙරෙන සියලුම ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම ; සහ

(ආ) එවැනි ක්‍රියාකාරකම්වලට අදාළව නිර්දේශයන් සිදු කිරීම සහ පනතේ 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සමෘද්ධි දිස්ත්‍රික් කමිටු වෙත එම නිර්දේශ ඉදිරිපත් කිරීම,

සංවිධානය විසින් සිදු කළ යුතු ය.

[4(1) (ඇ) නියෝගය]

**"ඇ" උපලේඛනය**

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමයේ සංයුතිය සහ පරිපාලන ව්‍යුහය**

**පූර්විකාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවන ලද 2013 අංක 1 දරන සමෘද්ධි පනත ප්‍රකාර වූ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමෙහි ලා සහ දිළිඳුබව තුරන් කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ අතිමහත් පුළුල් වූ අභිමතාර්ථයට පණ පෙවීම සඳහා පවතින මූල්‍ය වෙළඳපොල විසින් සේවා පිරිනැමීමෙහි ලා ප්‍රමුඛත්වයක් නොදක්වන ලද සුළු පරිමාණ ව්‍යවසායකයින් හා ග්‍රාමීය ජනතාව කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින් ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීමේ පෘථුල අභිමතාර්ථයන් අභිමුවෙහි තබා ගනිමින් මෙකී කාර්යයන් උදෙසා ප්‍රතිපත්තිමය රාමුවක් නිර්මාණය කිරීමේ අරමුණින් සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල කාර්යක්ෂම විධිමත්කරණය, නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා සියලුම සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල හා සමෘද්ධි ප්‍රජාමූල සමිතිවල සහභාගිත්වය සමගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙම සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය ස්ථාපනය කරනු ලැබේ.

1. ලිපිනය - ...............................................................................
2. දැක්ම - තිරසර සංවර්ධනයේ ක්ෂුද්‍ර මූල්‍ය සවිය.
3. මෙහෙවර - ධනාත්මක හා පරිසර හිතකාමී ආකල්ප ප්‍රවර්ධනය සමගින් සමාජ සවිබලගැන්වීම සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන්හට කාර්යක්ෂම හා සඵලදායී. ලෙස ක්ෂුද්‍ර මූල්‍ය සේවා සපයමින් සියලු සමෘද්ධිප්‍රජා මූල බැංකු හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවලට මග පෙන්වීම.
4. සාමාජිකත්වය - (1) ලියාපදිංචිය ලත් සියලු සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සංගමයේ සාමාජිකත්වය ලබාගත යුතු ය.

   (2) සාමාජිකත්වය ලබාගැනීම සඳහා ලියාපදිංචිය ලත් යම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක් විසින් අවම වශයෙන් එක් කොටසක්වත් ස්වකීය නාමයෙන් මිල දී ගෙන මහා සංගමයේ කොටස් ප්‍රාග්ධනයට දායක විය යුතු ය.

   (3) කොටසක නාමික අගය රුපියල් පන් දහසක් (රු. 5,000) විය යුතු ය.

5. අරමුණු - (අ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සම්බන්ධීකරණය කරමින් ප්‍රයෝගික සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ජාලයක් ප්‍රවර්ධනය කිරීම ;

(ආ) මූල්‍ය වෙළඳපොල කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සඳහා තාක්ෂණික මගපෙන්වීම සැපයීම ;

(ඇ) විධිමත් ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කටයුතුවලට සම්බන්ධ වීමට සමෘද්ධි ප්‍රතිලාභීන් පෙළඹවීම;

(ඈ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධිමත් කිරීම සහ ඒවායේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සඳහා ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම සඳහා (මෙහි මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට සහාය වීම ; සහ

(ඊ) සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ආයෝජන ශක්තිය හරහා නිර්මාණය වන්නා වූ ව්‍යවසායයන් ප්‍රවර්ධනය කිරීම.

6. බලතල හා කර්තව්‍යයන්. - (අ) සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල හා සමෘද්ධිප්‍රජාමූල බැංකු සමිතිවල කටයුතු අධීක්ෂණය කිරීම ;

(ආ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවලට ප්‍රති මූල්‍ය පහසුකම් සැපයීම ;

(ඇ) සමෘද්ධි ප්‍රජාමූල බැංකුවල සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කිරීම ;

(ඈ) නියෝග මගින් නියම කරනු ලැබ ඇති අරමුණු සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම ;

(ඉ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති වෙනුවෙන් ප්‍රතිරක්ෂකයකු ලෙස කටයුතු කිරීම ;

(ඊ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති නමින් තැන්පතු භාර ගැනීම ;

(උ) දිවයින පුරා ක්‍රියාත්මක වන්නාවූ සියලු සමෘද්ධි ප්‍රජාමූල බැංකුවලින් සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති වලින්, අවශ්‍ය වූ විට වාර්තා කැඳවීම ;

(ඌ) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සහ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති සම්බන්ධිත පරිපාලන කටයුතුවලදී චක්‍රලේඛ හරහා දෙපාර්තමේන්තුවට සහය වීම ; සහ

(එ) යම් රාජ්‍ය බැංකුවක, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහා සංගමය යන නාමයෙන් සභාපතිවරයා විසින් පවත්වාගෙන යනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන බැංකු ගිණුම් විවෘත කිරීම.

7. පරිපාලන ව්‍යුහය. - (1) මහා සංගමයේ කටයුතු කළමණාකරණය කිරීම, පහත සඳහන් සාමාජිකයින් පහළොස් දෙනකුගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් ඉටු කළ යුතු ය :-

(අ) (මෙහි මින්මතු "තෝරා පත් කරගත් අධ්‍යක්ෂවරු"යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල සභාපතිවරුන් නවදෙනකු, පළාත් නවය නියෝජනය කිරීම සඳහා තෝරා පත්කර ගත යුතු අතර, ඔවුන් අතරින් මණ්ඩලයේ සභාපතිවරයා හා උපසභාපතිවරයා තෝරා පත්කර ගත යුතු ය ;

(ආ) (මෙහි මින්මතු "නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරු" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවේ තැනැත්තන් තිදෙනෙක්, එනම් -

(i) දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය භාර අධ්‍යක්ෂවරයා ;

(ii) මණ්ඩලයේ ලේකම්වරයා බවට පත්විය යුතු, දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ;

(iii) දෙපාර්තමේන්තුවේ ප්‍රජාමූල සංවිධාන අංශය භාර අධ්‍යක්ෂවරයා.

(ඇ) (මෙහි මින්මතු "නම් කළ අධ්‍යක්ෂවරු" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද තැනැත්තන් තිදෙනෙකු.

(2) මණ්ඩලයේ තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරු එම කාර්යය සඳහා කැඳවනු ලබන රැස්වීමක දී සියලු සමෘද්ධි බැංකු සමිතිවල සභාපතිවරුන්ගේ එකිගත්වයෙන් තෝරා ගත යුතු ය.

(3) මණ්ඩලයේ සෑම තෝරා පත්කර ගත් අධ්‍යක්ෂවරයෙක් ම ඔහු මණ්ඩලයට පත් වූ දින සිට වසරක කාල සීමාවක් දක්වා ධූරය දැරිය යුතු අතර සංගමයේ සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ යඃ එසේ වුවද, තෝරා පත් කරගත් කිසිදු අධ්‍යක්ෂවරයකු යම් අනුයාත වසර දෙකක් සඳහා මණ්ඩලයේ සාමාජිකත්වය දැරීමට නැවත පත් කිරීම සඳහා සුදුස්සකු නොවන්නේ ය.

(4) මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යැවිය යුතු ය.

(5) යම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියකින් මහා සංගමයේ මණ්ඩලයට යම් සාමාජිකයකු තේරීමේ දී එකඟතාවයක් නොමැති අවස්ථාවක දී (2) වන ඡේදයේ විධිවිධාන ප්‍රකාරව සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිවල සාමාජික සභාපතිවරුන් අතරේ රහස්‍ය ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය.

(6) (5) වන ඡේදයේ සඳහන් කරන ලද රහස්‍ය ඡන්ද විමසීම අතරතුර දී තේරී පත්වීමට නියමිත සභාපතිවරයා හැර ප්‍රජාමූල බැංකු සමිතියේ සෑම සාමාජික සභාපතිවරයකු ම එක් මනාපයක් සඳහා සුදුසුකම් ලබන්නේය.

(7) (5) වන ඡේදයේ සඳහන් ඡන්ද විමසීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිලධරයකු, තේරීම් භාර නිලධරයා ලෙස කටයුතු කළ යුතු ය.

(8) යම් පළාතක් සඳහා එක් පරිපාලන දිස්ත්‍රික්කයක් පමණක් පවතින අවස්ථාවක දී හෝ පළාතක එක් පරිපාලන දිස්ත්‍රික්කයකින් පමණක් නාම යෝජනාවක් ඇති අවස්ථාවක දී, අනුයාත වසර දෙකක් හෝ වසර කිහිපයක් සඳහා, එම පරිපාලන දිස්ත්‍රික්කයෙන් එම සමාජිකයා මහා සංගමයට තෝරා පත්කරගත හැකි ය.

(9) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කැමැත්ත පරිදි, නම් කරන ලද අධ්‍යක්ෂවරු ධූර දැරුවද, අධ්‍යක්ෂ ජනරාල්වරයා අමතන ලිපියක් මගින් ඔවුන්ට තම ධූරයන්ගෙන් ඉල්ලා අස්විය හැකි ය.

සභාපතිවරයා හා උප සභාපතිවරයා.

(10) (1) වන ඡේදය ප්‍රකාරව තෝරා පත්කරගත් අධ්‍යක්ෂවරුන් නව දෙනා අතරේ පවත්වන්නා වූ රහස්‍ය ඡන්ද විමසීමක් මගින් සභාපතිවරයා සහ උප සභාපතිවරයා තෝරා පත් කරගත යුතු ය.

(11) සෑම අධ්‍යක්ෂවරයකු ම එක් ඡන්දයක් බැගින් ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලබයි. ඡන්ද විමසීමක දී සභාපතිවරයා හෝ උප සභාපතිවරයා ලෙස තේරී පත් වීමට තමා වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට කිසිදු අධ්‍යක්ෂවරයකු හිමිකම් නොලබයි.

(12) (10) වන ඡේදයේ සඳහන් කරන ලද රහස්‍ය ඡන්ද විමසීම ලේකම්වරයා විසින් පැවැත්විය යුතු ය. වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අධ්‍යක්ෂවරයා, සභාපතිවරයා ලෙසින් තෝරා පත්කර ගත යුතු අතර, ඊළඟට වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත් අධ්‍යක්ෂවරයා, උප සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගත යුතු ය.

(13) (10) වන ඡේදයේ සඳහන් කරන ලද රහස්‍ය ඡන්ද විමසීමක දී, තේරී පත් වූ යම් අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගේ ඡන්ද ප්‍රමාණය සමාන වන අවස්ථාවක දී, ලේකම්වරයා විසින් කුසපත් ඇදීමෙන් සභාපතිවරයා සහ උප සභාපතිවරයා තෝරා පත් කළ යුතු ය.

ලේකම්වරයා

(14) දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, සංගමයේ නිල බලයෙන් පත් වූ ලේකම්වරයා වශයෙන් ක්‍රියා කළ යුතු ය.

8. අධ්‍යක්ෂවරයකු වීම සඳහා නුසුදුසුකම්.- යම් තැනැත්තකු -

(අ) වයස අවුරුදු 70ට එළඹී සිටී නම් ;

(ආ) අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබ සිර දඬුවම් නියම වූ අයෙකු නම් ;

(ඇ) පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවක හෝ මන්ත්‍රීවරයකු, පළාත් පාලන ආයතනයක සභිකයකු වන හෝ එවැනි මන්ත්‍රීවරයෙකු හෝ සභිකයෙකු බවට පත්වන අයෙකු නම් ;

(ඈ) ජනරජයේ ජනාධිපතිවරයා වන හෝ ජනාධිපතිවරයා වශයෙන් පත්වන අයෙකු නම් ;

(ඉ) යම් පළාතක ආණ්ඩුකාරවරයා හෝ ආණ්ඩුකාරවරයා වශයෙන් පත්වන අයකු නම් ;

(ඊ) වෙනත් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක සේවකයකු වන හෝ සේවකයකු බවට පත්වන අයෙකු නම්;

(උ) කායික හා මානසික දුබලතාවකින් පෙළෙන අයෙකු නම්,

ඔහු මණ්ඩලයේ තේරී පත් වූ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට හෝ අධ්‍යක්ෂවරයකු වශයෙන් දිගටම රැඳී සිටීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

## 02 වන පරිච්ඡේදය

### රැස්වීම්

9. වාර්ෂික මහා සභා රැස්වීම - ලේකම්වරයා විසින් මණ්ඩලයේ මගපෙන්වීම යටතේ සෑම ලිත් වර්ෂයකම පළමු කාර්තුව තුළ සාමාජිකයන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු අතර සෑම වාර්ෂික මහා සභා රැස්වීමකදී ම පහත කටයුතු සිදු කළ යුතු ය :-

(අ) අදාළ වර්ෂය සඳහා සංගමයේ මණ්ඩලය තෝරා පත්කර ගැනීම ;

(ආ) පසුගිය වසර සඳහා වූ ප්‍රගති සමාලෝචන වාර්තාව සලකා බැලීම ;

(ඇ) පසුගිය වසරේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතියට අදාළ ප්‍රගති සමාලෝචන වාර්තාව සලකා බැලීම ;

(ඈ) සංගමයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී ලබාගත් ප්‍රගතිය සමාලෝචනය කිරීම ;

(ඉ) පසුගිය වසරේ අනුමත කරන ලද ගිණුම් ප්‍රකාශය සඳහා අනුමතය ලබා ගැනීම.

10. විශේෂ මහා සභා රැස්වීම. - (1) සාමාජිකයන් හතරෙන් එකකට නොඅඩු වූ සංඛ්‍යාවක් විශේෂ සභා රැස්වීමක් පැවැත්වීමට සභාපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කළ විට සභාපතිවරයා විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමට විධාන කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවීමේ අවශ්‍යතාවක් ඇතැයි තීරණය කළ ඕනෑම අවස්ථාවක දී, විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය හැකිය.

11. මණ්ඩලයේ රැස්වීම්. - (1) කළමනාකරණ අවශ්‍යතාවන් මත වරින් වර මණ්ඩලයේ රැස්වීම් කැඳවිය හැකි අතර, එම රැස්වීමේ දී ඊළඟ රැස්වීම් දිනය, වේලාව හා ස්ථානය තීරණය කළ යුතු ය.

(2) වාර්ෂික මහා සභා රැස්වීමේ දී මණ්ඩලයේ පළමුවන රැස්වීමේ දිනය, වේලාව හා ස්ථානය තීරණය කළ යුතු ය.

(3) අවම වශයෙන් සෑම තෙමසකටම එක් වරක්වත් මණ්ඩලය රැස්විය යුතු ය.

12. රැස්වීම් වාර්තා. - (1) සෑම රැස්වීමකම වාර්තා ලේකම්වරයා සහ සභාපතිවරයා විසින් අත්සන් කොට, ගොනු ගත කොට තබා ගත යුතු ය.

(2) යම් රැස්වීමක කාර්ය සටහන් ප්‍රකාරව, යම් සමෘද්ධි බැංකුවකට හෝ සමෘද්ධි බැංකු සමිතියක විධානයක් ලබා දීම අවශ්‍ය වන්නා වූ විට, ලේකම්වරයා විසින් වහාම එම විධානය අදාළ බැංකුවට හෝ බැංකු සමිතියට යොමු කළ යුතු ය."

13. දැන්වීම් - (1) සෑම රැස්වීමක් පිළිබඳව වූ දැන්වීම් ලේකම්වරයා විසින් අදාළ රැස්වීමට සහභාගී වීමට සුදුසුකම් ලබන සෑම සමෘද්ධි බැංකු සමිතියකටම යැවීමට කටයුතු කළ යුතුය.

(2) සෑම දැන්වීමක් ම අදාළ බැංකු සමිතියේ ප්‍රධාන කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවීමට කටයුතු කළ යුතු ය ඃ

එසේ වුවද, අදාළ බැංකු සමිතිය වෙත වෙනත් යම් සාධනීය ආකාරයකින් භාරදෙනු ලැබ, එම සමිතිය මගින් භාර ගනු ලැබූ සෑම දැන්වීමක් ම නිසි පරිදි භාර දීමක් ලෙසින් සැලකිය යුතු ය.

(3) රැස්වීමේ දිනයට යටත් පිරිසෙයින් දින දාහතරකට පෙරාතුව රැස්වීම් සඳහා වන දැන්වීම් යැවීමට කටයුතු කළ යුතු ය.

(4) ඊට අමතරව, එවැනි සෑම දැන්වීමක් ම සංගමයේ ප්‍රධාන කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු අතර, එවැනි දැන්වීම් අවම වශයෙන් රැස්වීමට පෙරාතුව දින හතක කාලයක්වත් ප්‍රදර්ශනය කළ යුතු ය ඃ

එසේ වුවද, විශේෂ මහා සභා රැස්වීමක් සඳහා වන දැන්වීමක් අවම වශයෙන් වැඩකරන දින පහකටවත් පෙරාතුව යැවීමට කටයුතු කළ යුතු ය.

(5) හදිසි කරුණක් නිසා කැඳවනු ලබන මණ්ඩලයේ රැස්වීමක් සම්බන්ධයෙන් වන විට අදාළ මණ්ඩල සාමාජිකයින් විසින් විධිමත්ව අවසන් වරට සපයා ඇති සාමාජිකයාගේ ජංගම දුරකතන අංකයට යවනු ලබන කෙටි පණිවුඩයක් මගින් හෝ අදාළ සාමාජිකයා විසින් විද්‍යුත් තැපැල් ලිපිනයක් සපයා ඇත්නම් එකී ලිපිනයට යවනු ලබන විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් අදාළ දැන්වීම යොමු කළ හැකිය.

14. ගණපූරණය. - (1) මණ්ඩලයේ රැස්වීමක් සඳහා වන ගණපූරණය හතක් විය යුතු අතර, අවම වශයෙන් තෝරාපත් කරගත් අධ්‍යක්ෂවරුන් පස්දෙනකු, නිල බලයෙන් පත් වූ එක් අධ්‍යක්ෂවරයකු හා නම් කරන ලද එක් අධ්‍යක්ෂවරයකු ඇතුළත් විය යුතු ය.

(2) මහා සභා රැස්වීමක් සඳහා වන ගණපූරණය, මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට සමාන සංඛ්‍යාවක් වන්නේ ය.

(3) මණ්ඩලයේ අනුයාත රැස්වීම් තුනකට දැනුම් දීමකින් තොරව සහභාගී වීමට අපොහොසත් වන්නා වූ, තෝරාපත් කර ගත් හෝ නම් කරන ලද යම් අධ්‍යක්ෂවරයකු, ධුරයෙන් ඉවත් කරන ලද සේ සැලකිය යුතු ය. 7 (1) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන මණ්ඩලයට නව අධ්‍යක්ෂවරයකු පත් කළ යුතු ය.

15. ඡන්දය දීමේ බලය. (1) යම් මහා සභා රැස්වීමක දී යම් යෝජනාවක් සම්මත කිරීම සඳහා සමිතියේ කොටස් හිමියකු වන සෑම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක් ම ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලැබිය යුතු අතර ඡන්ද ප්‍රමාණය සමාන වන අවස්ථාවක දීඃ මුලසුන දරන තැනැත්තාට තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(2) පැමිණ සිටින හා ඡන්දය ප්‍රකාශ කරන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සම්මත කළ යුතු යයි, මණ්ඩලය විසින් තීරණය කරන ලද යෝජනාවන් හැර වෙනත් සෑම යෝජනාවක් ම සාමාන්‍ය බහුතර ඡන්දයෙන් සම්මත කළ යුතු ය.

(3) සංගමයේ යම් මහා සභා රැස්වීමක දී, යම් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියක් වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා එහි සභාපතිවරයාට හිමිකම ඇති අතර, සභාපතිවරයා පැමිණ නොසිටියේ නම් උප සභාපතිවරයාට ද, සභාපතිවරයා හා උප සභාපතිවරයා යන දෙදෙනා පැමිණ නොසිටියේ නම් අදාළ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සංගමය නියෝජනය කරමින් පැමිණ සිටින යම් එක් විධායක කමිටු සාමාජිකයකුට ද ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම ඇත්තේ ය.

(4) මණ්ඩලයේ සභාපතිවරයා, සංගමයේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා නොපැමිණි විට උප සභාපතිවරයා රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර, සභාපතිවරයා හා උප සභාපතිවරයා යන දෙදෙනාම නොපැමිණි විට එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා පැමිණ සිටින තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයකු තෝරා පත්කර ගත යුතු ය.

**3 වන පරිච්ඡේදය**

**අරමුදල**

16. (1) සංගමයට වෙනම අරමුදලක් තිබිය යුතු ය.

(2) එම අරමුදලට -

(අ) සමෘද්ධිබැංකු සමිතිවලට කොටස් නිකුත් කිරීමෙන් උපචිත වූ සියලු මුදල් ;

(ආ) දෙපාර්තමේන්තුව විසින් කලින් කල සපයනු ලබන සියලු මුදල් ; සහ

(ඇ) ආයෝජනවල ලාභ සහ පොළී වශයෙන් ලැබෙන සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) අරමුදලේ මුදල්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක තැන්පත් කළ යුතු ය.

(4) යම් බැංකුවක එසේ තැන්පත් කරන ලද අරමුදල් කළමනාකරණය කිරීම, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මගපෙන්වීම යටතේ මණ්ඩලය විසින් කළ යුතු ය.

**( 7 වන නියෝගය)**

**ඈ උපලේඛනය**

**සාමාජික කාඩ්පත**

**............................ ප්‍රජාමූල සංවිධානය**

දිස්ත්‍රික්කය: - ......................ප්‍රා. ලේ. කො :- ....................ග්‍රා. නි.කො. :- .....................

ලියාපදිංචිඅංකය: -..................................

සාමාජිකයාගේ නම :- ..........................................................

ලිපිනය :- .........................................................

උපන් දිනය: -.......................................................

හැඳුනුම්පත් අංකය :- ........................................................

නිකුත් කල දිනය :- ..........................................................

...................................... ......................................

සභාපති ලේකම්

සමෘද්ධි සංවර්ධන නිලධාරි :- ..........................................................

....................................................

සමෘද්ධි කළමනාකරු (නිල මුද්‍රාව)

( 8 වන නියෝගය)

ඉ උපලේඛනය

03 - 947/1

එල්.ඩී-බී 13/2013 (නියෝග)

**2013 අංක 1 දරන සමෘද්ධි පනත**

2013 අංක 1 දරන සමෘද්ධි පනතේ 25(2) සහ 29(2) වගන්ති සමග කියවිය යුතු 42 වන වගන්තිය යටතේ සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

එස්. බී. දිසානායක (පා.ම.),
සමාජ සවිබලගැන්වීම් සහ
සුභසාධන අමාත්‍ය.

2017 මාර්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2017 අංක 2 දරන සමෘද්ධි නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග මගින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති ලියාපදිංචි කිරීම සහ ඊට ආනුෂංගික වෙනත් කරුණු පිළිබඳ විධිවිධාන සලසනු ලැබේ.

3. (1) පනතේ 25 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සෑම සමෘද්ධිප්‍රජා මූල බැංකුවක් ම සහ පනතේ 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සෑම සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක් ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරනු ලබන නමක් යටතේ, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියාපදිංචි විය යුතු ය.

(2) සෑම සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක් ම සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක් ම ලියාපදිංචි කරනු ලබන්නේ යම් නමක් යටතේ ද, ඒ නමෙහි අදාළ බැංකුවේ හෝ සමිතියේ බල ප්‍රදේශය දක්වන්නා වූ යෙදුමක් ඇතුළත් විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ''ප්‍රජා මූල බැංකුව'' හෝ ''ප්‍රජා මූල බැංකු සමිතිය'' යන යෙදුම ඇතුළත් විය යුතු ය.

4. සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍ර මෙහි 'අ' උපලේඛනයේ, පිළිවෙළින්, 1 වන කොටසේ සහ 2 වන කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිවලට සාරානුකූලව, ලියාපදිංචි කිරීමේ ගාස්තුවද සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළයුතු ය.

5. (1) 4 වන නියෝගය යටතේ ඉදිරිපත් කරන ලද සමෘද්ධි ප්‍රජා මූල බැංකුවකම හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියකම ඉල්ලුම්පත්‍රයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබීමේ දී, ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති කරුණු විශ්වසනීය මූලාශ්‍ර මගින් සත්‍යායනය කරන ලෙස සහ අදාළ බැංකුව හෝ සමිතිය ලියාපදිංචි කිරීම යෝග්‍ය වන්නේ ද යන්න පිළිබඳව නිර්දේශ ලබා දෙන ලෙස, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා ඔහු විසින් බලය පවරන ලද දෙපාර්තමේන්තුවේ නිලධරයකුට විධානය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ ලබාගන්නා ලද නිර්දේශ සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් දින තිහක කාලසීමාවක් ඇතුළත අදාළ බැංකුව හෝ සමිතිය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ ලබාගන්නා ලද නිර්දේශ සැලකිල්ලට ගැනීමෙන් පසුව, ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සමෘද්ධි ප්‍රජා මූල බැංකුව හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය, ලියාපදිංචි කිරීම යෝග්‍ය නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් හේතු දක්වමින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(4) ඉල්ලුම්පත්‍රය ලැබීමෙන් දින දාහතරක කාලසීමාවක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණය අදාළ සමෘද්ධි ප්‍රජා මූල බැංකුව වෙත හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) මේ නියෝග යටතේ ලියාපදිංචි කරනු ලබන සෑම සමෘද්ධි ප්‍රජා මූල බැංකුවකට ම සහ සමෘද්ධිප්‍රජා මූල බැංකු සමිතියකට ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ලියාපදිංචි කිරීමේ සහතික, මෙහි 'ආ' උපලේඛනයේ පිළිවෙළින් 1 වන කොටසේ සහ 2 වන කොටසේ නිශ්චිතව දක්වා ඇති ආකෘතිවලට සාරානුකූලව නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) සෑම සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක ම සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක ම ලියාපදිංචිය, සෑම වර්ෂයකම මාර්තු මස තිස් එක් වන දිනට යටත් පිරිසෙයින් දින තිහකට වත් පෙරාතුව, 4 වන නියෝගය යටතේ ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මගින් අලුත් කරනු ලැබිය යුතු ය.

6. පනතේ 34 වන වගන්තිය යටතේ පිහිටුවන ලැබිය යුතු ලද සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සමෘද්ධි ප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවලට අදාළ වන පහත කරුණු නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා කලින් කල, ලිඛිත මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය :-

(අ) එක් එක් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ පාලක මණ්ඩලය පත් කිරීම, පාලක මණ්ඩලයේ සාමාජිකයන් සංඛ්‍යාව, ධුර කාලය, ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම පිළිබඳව ;

(ආ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවල පාලක මණ්ඩලවල රැස්වීම් පැවැත්වීම, රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ;

(ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල සහ සමෘද්ධිප්‍රජා මූල බැංකු සමිතිවල පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ඒ බැංකුවලට සහ බැංකු සමිතිවලට කාර්ය මණ්ඩලය සහ වෙනත් සේවා සපයන්නන් පත් කිරීම පිළිබඳව ꞉

එසේ වුව ද, නියෝග මගින් නියම කර ඇති පරිදි සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයේ පළමුවන අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන තුරු, මේ නියෝගයේ කාර්ය සඳහා යම් මාර්ගෝපදේශයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

7. (1) පනතේ 33 වන වගන්තිය යටතේ පත් කරන ලද (මෙහි මින්මතු ''කළමනාකරණ මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සමෘද්ධිප්‍රජා මූල බැංකු සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරණ මණ්ඩලය විසින්, පහත කරුණු ද ඇතුළත්ව, සමෘද්ධිප්‍රජා මූල බැංකුවල සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවල මූල්‍ය කටයුතු අධීක්ෂණය සහ නියාමනය කිරීම පිළිබඳ සියලු කරුණු නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ සඳහා කලින් කල විධාන නිකුත් කරනු ලැබිය යුතු ය ꞉-

(අ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල හා සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවල ලියාපදිංචි කිරීමේ ගාස්තුව ;

(ආ) රැස්වීම්වලට සහභාගීවීම සඳහා සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවල පාලක මණ්ඩලවලට ගෙවිය යුතු දීමනා පිළිබඳව ;

(ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවල සහ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිවල කාර්යය මණ්ඩලයට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ ඒවාට සේවා සපයන්නන් සිටී නම්, එම සේවා සපයන්නන්ට කළ යුතු ගෙවීම් පිළිබඳව ;

(ඇ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවලින් ඒවායේ සාමාජිකයන්ට ලබා දෙන්නේ කවර ආකාරයේ ණය සහ වෙනත් මූල්‍ය සේවා ද යන්නත්, ඒ සේවාවලට අදාළ ණය සඳහා ණයවර කාලසීමාව, ණය සහ තැන්පතු සඳහා පොළී අනුපාත සහ ණය ලබාදෙන උපරිම සීමාව වැනි, නියම සහ කොන්දේසි පිළිබඳව ;

(ඉ) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවලින් ඒවායේ සාමාජිකයන් නොවන අයට ලබා දෙන්නේ කවර ආකාරයේ මූල්‍ය සේවා ද යන්නත්, ඒ සේවාවලට අදාළ නියම සහ කොන්දේසි පිළිබඳව.

(2) කළමනාකරණ මණ්ඩලයේ සියලු තීරණ, එවැනි යම් තීරණයක් ගැනීම සඳහා කැඳවනු ලබන, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් දෙකෙන් එකකට වඩා පැමිණ ඡන්දය ප්‍රකාශ කරන රැස්වීමක දී, වැඩි ඡන්දයෙන්, ගනු ලැබිය යුතු ය.

8. (1) යම් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක කොටස්, පනතේ 25(1) වගන්තිය යටතේ ඒ බැංකුව පිහිටුවනු ලැබ ඇති ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සමෘද්ධිප්‍රජා මූල සංවිධානය හෝ සංවිධානවල සාමාජිකයන් විසින් දරනු ලැබිය යුතු ය.

(2) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක සෑම කොටස්හිමියකු ම, එම සමෘද්ධිප්‍රජා මූල බැංකුවේ සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බැංකුව විසින් සපයනු ලබන ක්ෂුද්‍ර මූල්‍ය සේවා ලබා ගැනීමට හිමිකම ලබන්නේ ය.

9. (1) යම් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක කොටස්, පනතේ 29(1) වගන්තිය යටතේ ඒ බැංකු සමිතිය පිහිටුවනු ලැබ ඇති ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන, ලියාපදිංචි සමෘද්ධිප්‍රජා මූල බැංකුවක හෝ බැංකුවල සාමාජිකයන් විසින් දරනු ලැබිය යුතු ය.

(2) සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක සෑම කොටස් හිමියකු ම, එම සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ ආයතනික සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර එම බැංකු සමිතිය විසින් පිහිටුවනු ලැබ ඇති ක්ෂුද්‍ර මූල්‍ය සේවා ජාලයට අදාළ වන සේවා ලබා ගැනීමට හිමිකම ලබන්නේ ය.

10. (1) සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයේ කොටස්, මේ නියෝග යටතේ ලියාපදිංචි වී සිටින සමෘද්ධිප්‍රජා මූල බැංකු සමිතිවල සාමාජිකයන් විසින් දරනු ලැබිය යුතු ය.

(2) සමෘද්ධි ප්‍රජා මූල බැංකු මහා සංගමයේ සෑම කොටස් හිමියකු ම, එම මහා සංගමයේ ආයතනික සාමාජිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ මහා සංගමයෙන් එම ආයතනික සාමාජිකයන් වෙත පිරිනමනු ලබන සේවා ලබා ගැනීමට හිමිකම ලබන්නේ ය.

11. මේ නියෝගවල, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''පනත'' යන්නෙන්, 2013 අංක 1 දරන සමෘද්ධි පනත අදහස් වේ ;

''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යන්නෙන් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලැබ ඇති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

''දෙපාර්තමේන්තුව'' යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබ ඇති සමෘද්ධිසංවර්ධන දෙපාර්තමේන්තුව අදහස් වේ ;

''පාලක මණ්ඩලය'' යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක පාලක මණ්ඩලය හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියක විධායක කමිටුව අදහස් වේ.

**4 වන නියෝගය**

**අයදුම් පත් අංකය** D/B/R/01

| |
|---|
| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා :- |
| යොමු අංකය :- |
| අයදුම්පත්‍රය ලද දිනය :- |
| බැංකුවේ ලියාපදිංචි අංකය :- |
| බලයලත් නිලධාරියාගේ අත්සන :- |

**(අ) උපලේඛනය - 1 වන කොටස**

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය**

(1) සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ නම :-..................................................................................................

(2) ලිපිනය: ..............................................................................................................................

(3) දුරකථන අංකය : ............................................. ඊ මේල් ලිපිනය:..................................................

(4) බල ප්‍රදේශය: ..................පළාත..............................දිස්ත්‍රික්කය: ....................................................
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - (ඇමුණුම 01හි සඳහන් ප්‍රජා මූල සංවිධාන බල ප්‍රදේශය ආවරණය වන/භූගෝලීය ප්‍රදේශය)

(5) දිස්ත්‍රික්කයට ලබාදී ඇති පරිපාලන අංකය :..............................

(6) බැංකුව අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලන අංකය :..............................

(7) බැංකුවට/කලාපයට ලබාදී ඇති අංකය :..............................

(8) බැංකුව අයත් ප්‍රජා මූල බැංකු සමිතියේ නම:-

(9) මහ සභා රැස්වීම් තොරතුරු :.............................. (ඇමුණුම 02 )

(10) පාලක මණ්ඩල තොරතුරු:.............................. (ඇමුණුම 03)

(11) බැංකුවේ කොටස්හිමියන් පිළිබඳ විස්තරය (20........../12/31 දිනට)

| | 20......./12/31 | |
|---|---|---|
| | සංඛ්‍යාව | මුදල |
| ස්ත්‍රී | ........................ | ..................... |
| පුරුෂ | ........................ | ..................... |
| මුළු එකතුව | | |

(12) 20 ........./12/31 දිනට මූල්‍ය ප්‍රකාශය අනුව

මුළු වත්කම් වල එකතුව ...........................................

මුළු වගකීම් වල එකතුව ........................................... (ඇමුණම 04)

(13) 20......./12/31 යට ආදායම් ප්‍රකාශය අනුව ලාභය හෝ අලාභය : .................................................(ඇමුණුම 05)

(14) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන වර්ෂය: .................................

ලංකා බැංකුවේ /මහජන බැංකුවේ ..................... අංක දරන ..................... දිනැති ....................වටිනා චෙක්පත වාර්ෂික ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් යොමු කර ඇත. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අප බැංකුව ලියාපදිංචි කරන ලෙස කාරුණිකව ඉල්ලමු.

| | |
|---|---|
| ගරු සභාපතිගේ අත්සන :- | ලේකම්ගේ අත්සන :- |
| නම :...................... | නම :...................... |
| නිල මුද්‍රාව :- | නිල මුද්‍රාව :- |

ඉහත තොරතුරු හා ඇමුණුම් මගින් ලබාදී ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ කළමණාකරුගේ නම :-
අත්සන :-
ප්‍රජා මූල බැංකු සමිතියේ නම :-

ඇමුණුම 01

**.......................................... සමෘද්ධි ප්‍රජාමූල බැංකු බල ප්‍රදේශයට අයත් ප්‍රජාමූල**

**සංවිධාන නාම ලේඛනය**

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :- ප්‍රජාමූල බැංකුවේ නම :-

| *අනු. අංකය* | *ග්‍රාම නිලධාරී කොට්ඨාසය සහ අංකය* | | *ප්‍රජාමූල සංවිධානයේ නම* | *ලිපිනය* |
|---|---|---|---|---|
| 01 | | 1 | | |
| | | 2 | | |
| | | 3 | | |
| | | 4 | | |
| | | 5 | | |
| 02 | | 6 | | |
| | | 7 | | |
| | | 8 | | |
| | | 9 | | |
| | | 10 | | |
| 03 | | 11 | | |
| | | 12 | | |
| | | 13 | | |
| | | 14 | | |
| | | 15 | | |
| 04 | | 16 | | |
| | | 17 | | |
| | | 18 | | |
| | | 19 | | |
| | | 20 | | |
| 05 | | 21 | | |
| | | 22 | | |
| | | 23 | | |
| | | 24 | | |
| | | 25 | | |

*සටහන :*

(මෙම ලේඛනය පළමු වර ලියාපදිංචියට ඉදිරිපත් කිරීමේ දී පමණක් ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචියට වාර්ෂිකව තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ප්‍රජා මූල සංවිධානවල වෙනස් වීම් පමණක් මෙම ලේඛනය මගින් පසුව ඉදිරිපත් කළ යුතු ය.)

ඇමුණුම 02

**මහා සභා රැස්වීම් හා පාලක මණ්ඩල රැස්වීම්**

| | |
|---|---|
| වාර්ෂික මහා සභාව පැවැත් වූ දිනය | |
| විශේෂ රැස්වීම් පැවැත්වූයේ නම් දින | |

**පාලක මණ්ඩල රැස්වීම්**

| | |
|---|---|
| මෙම වර්ෂය තුළ පැවැත් වූ රැස්වීම් සංඛ්‍යාව | |
| අවසන්වරට රැස්වීම් පැවැත් වූ දිනය | |
| සන පූර්ණය නොතිබීමෙන් නොපැවැත් වූ රැස්වීම් | |

*සටහන :*

ප්‍රජාමූල බැංකුවට පාලක මණ්ඩලය පත් කර ගැනීම සඳහා පවත්වනු ලැබූ මහා සභා රැස්වීම් වාර්තාවේ පිටපතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයා විසින් සහතික කරනු ලැබ මේ සමග ඉදිරිපත් කළ යුතු ය.

ඇමුණුම 03

**පාලක මණ්ඩල තොරතුරු**

| | | දුරකථන අංකය |
|---|---|---|
| සභාපතිගේ නම | | |
| උප සභාපතිගේ නම | | |
| ලේකම්ගේ නම | | |

| *පාලක මණ්ඩල සාමාජිකයින්ගේ නම් (සභාපති හා උප සභාපති ඇතුළුව)* | *ලිපිනය* | *ප්‍රජාමූල සංවිධානයේ නම* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම :-

ප්‍රජාමූල බැංකුවේ නම :-

*ඇමුණුම 04*

........................ සමෘද්ධි ප්‍රජාමුල බැංකුව
..................... දිනට මුල්‍ය ප්‍රකාශය

| *වත්කම්* | ........... වර්ෂය | ........... වර්ෂය | වෙනස (%) |
|---|---|---|---|
| ද්‍රවශීලී වත්කම් | | | |
| *ද්‍රවශීලී නොවන වත්කම්* | | | |
| ආයෝජන | | | |
| ණය | | | |
| ලිපිද්‍රව්‍ය තොග | | | |
| ලැබිය යුතු දෑ | | | |
| වෙනත් වත්කම් | | | |
| දේපළ පිරියත උපකරණ | | | |
| මුළු වත්කම් | | | |
| *වගකීම්* | | | |
| තැන්පත් | | | |
| ප්‍රතිමුල්‍ය | | | |
| ගෙවිය යුතු දෑ | | | |
| සංචිත | | | |
| අරමුදල් | | | |
| වෙනත් | | | |
| හිමිකම් | | | |
| මුළු වගකීම් | | | |

.................. දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සකස් කරන ලද ආදායම් ප්‍රකාශය හා .................. දිනට සකස් කරන ලද ශේෂ පත්‍රය සමග ඉදිරිපත් කරන ගිණුම් සටහන් නිවැරදි බවට සහතික කරමු.

කළමනාකරුගේ අත්සනඃ -
නමඃ-
දිනය ඃ-

සභාපතිගේ අත්සනඃ-
නමඃ-
දිනයඃ-

*ඇමුණුම 05*

**........................ සමෘද්ධි ප්‍රජාමුල බැංකුව**
**.......................... දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | .............වර්ෂය | .............වර්ෂය | වෙනස(%) |
|---|---|---|---|
| 1 පොළී ආදායම | | | |
| 2 පොළී වියදම | | | |
| 3 ශුද්ධ පොළී ආදායම | | | |
| 4 වෙනත් ආදායම් | | | |
| 5 මෙහෙයුම් ආදායම | | | |
| <u>මෙහෙයුම් වියදම්</u> | | | |
| 1 පරිපාලන වියදම් | | | |
| 2 ආයතන වියදම් | | | |
| 3 රක්ෂණ ආවරණ වියදම් | | | |
| 4 සංචිත සඳහා වෙන් කිරීම | | | |
| 5 වෙනත් වියදම් | | | |
| 6 ශුද්ධ ලාභය /(අලාභය) | | | |

ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.

කළමණාකරුගේ නම :-
අත්සන :-

සභාපතිගේ නම :-
අත්සන :-

අයදුම් පත්‍ර අංකය D/B/R/02

''අ'' උපලේඛනය - 2 වන කොටස

| |
|---|
| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා :- |
| යොමු අංකය :- |
| අයදුම්පත්‍රය ලද දිනය :- |
| බැංකු සමිතියේ ලියාපදිංචි අංකය :- |
| බලයලත් නිලධාරියාගේ අත්සන :- |

සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.

(1) සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ නම :-..........................................................................................................

(2) ලිපිනය :- ..........................................................................................................................................

(3) දුරකථන අංකයඃ - ............................................ ඊමේල් ලිපිනය -:-..........................................

(4) බල ප්‍රදේශයඃ ................................ පළාතඃ............................දිස්ත්‍රික්කයඃ.........................

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බල ප්‍රදේශය

(5) දිස්ත්‍රික්කයට ලබා දී ඇති පරිපාලන අංකය :-............................ ප්‍රා.ලේ.කොට්ඨාසයේ පරිපාලන අංකයඃ-...........................

(6) ප්‍රජා මූල බැංකු සමිතියට අයත් ප්‍රජා මූල බැංකුවල නම්ඃ-

(7) තේරී පත්වූ විධායක කමිටු සාමාජික ලේඛනය (ඇමුණුම 01)

(8 ) 20........./12/31 දිනට මූල්‍ය ප්‍රකාශය අනුව(ඇමුණුම 02)

මුළු වත්කම්වල එකතුව :-..............................

මුළු වගකීම්වල එකතුව :-..........................................

(9) ආදායම් ප්‍රකාශය අනුව ශුද්ධ ලාභය හෝ අලාභය......................දිනෙන් අවසන් වර්ෂය සඳහා (ඇමුණුම 03)

(10) මහා සභා රැස්වීම්

වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වූ දිනයඃ- ............................

විශේෂ මහ සභා රැස්වීම් පැවැත්වූ දිනඃ-.................................

(11) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන වර්ෂය :-..............................

ලංකා බැංකුවේ/මහජන බැංකුවේ ....................... අංක දරන ............. දිනැති ........................ වටිනා චෙක්පත වාර්ෂික ලියාපදිංචි ගාස්තුව වශයෙන් යොමු කර ඇත. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අප බැංකු සමිතිය ලියාපදිංචි කරන ලෙස කාරුණිකව ඉල්ලමු.

| | |
|---|---|
| ගරු සභාපතිගේ අත්සනඃ- | ලේකම්ගේ අත්සනඃ- |
| නම :- | නමඃ- |
| නිල මුද්‍රාව :- | නිල මුද්‍රාවඃ- |

ඉහත සඳහන් තොරතුරු හා ඇමුණුම් මගින් දක්වා ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා පත් කළ නිලධරයාගේ නම (මූලස්ථාන කළමණාකරු)ඃ-

අත්සනඃ-
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නමඃ-

*ඇමුණුම 01*

ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු නාම ලේඛනය

ප්‍රජාමූල බැංකු සමිතියේ නම :- ..........................................................................

| | | |
|---|---|---|
| සභාපතිගේ නම:- | ලිපිනය:- | දුරකථන අංකය |
| උප සභාපතිගේ නම:- | ලිපිනය:- | |
| ලේකම්ගේ නම:- | ලිපිනය:- | |

සෙසු විධායක කමිටු සාමාජික තොරතුරු :

| අනු. අංකය | විධායක කමිටු සාමාජික නම | ලිපිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

*සටහන :*

ප්‍රජාමූල බැංකු සමිතියට විධායක කමිටු සාමාජිකයන් තේරී පත්වූ වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාවේ පිටපතක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයා විසින් සහතික කරනු ලැබ මේ සමග ඉදිරිපත් කළ යුතුය.

*ඇමුණුම 02*

**සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය**
**.................... දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය**

| **වත්කම්** | වර්ෂය | වර්ෂය | වෙනස (%) |
|---|---|---|---|
| ද්‍රවශීලී වත්කම් | | | |
| **ද්‍රවශීලී නොවන වත්කම්** | | | |
| ඉතිරි තැන්පතු | | | |
| වෙනත් වත්කම් | | | |
| ලැබිය යුතු දෑ | | | |
| ලිපිද්‍රව්‍ය තොග | | | |
| ලැබිය යුතු ප්‍රතිමූල්‍ය | | | |
| ආයෝජන | | | |
| අඩමාන ආයෝජන | | | |
| දේපළ පිරියත හා උපකරණ | | | |
| මුළු වත්කම් | | | |
| **වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | | | |
| ගෙවිය යුතු ප්‍රතිමූල්‍ය ණය | | | |
| වෙනත් වගකීම් | | | |
| අරමුදල් | | | |
| සංචිත | | | |
| හිමිකම් | | | |
| මුළු වගකීම් | | | |

.................. දිනෙන් අවසන් වර්ෂය සඳහා සකස් කරන ලද ආදායම් ප්‍රකාශය හා .................. දිනට සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශය සමග ඉදිරිපත් කරන ගිණුම් සටහන් නිවැරදි බවට සහතික කරමු.

ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ අත්සන : -
නම :-
දිනය :-

විධායක කමිටු සභාපතිගේ අත්සන :-
නම :-
දිනය :-

*ඇමුණුම 03*

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය**

**.......................... දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය**

| | .............වර්ෂය | .............වර්ෂය |
|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | |
| අඩු කළා | | |
| **<u>මෙහෙයුම් වියදම්</u>** | | |
| පරිපාලන වියදම් | | |
| ආයතනික වියදම් | | |
| රක්ෂණ ආවරණ වියදම් | | |
| සංචිත | | |
| වෙනත් වියදම් | | |
| පොලී වියදම් - ප්‍රතිමූල්‍ය ණය | | |
| ශුද්ධ ලාභය /අලාභය | | |

ඉහත තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

කළමණාකරු ................................. නම :- සභාපතිගේ නම :-

අත්සන :- අත්සන :-

5 (5) වන නියෝගය)

උපලේඛනය ''ආ'' - 1 වන කොටස

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ**
**ප්‍රජා මූල බැංකු ලියාපදිංචි කිරීමේ සහතිකය**

.................................................................................................................... යන ලිපිනය දරණ

.......................................................................................................................... සමෘද්ධි ප්‍රජා

මූල බැංකුව 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ, 25(2)හි විධිවිධාන ප්‍රකාරව ................................................ අංකය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කළ බව මෙයින් සහතික කරමි.

.................................
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

දිනය .................................

**ආ උපලේඛනය - 2 වන කොටස**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ**
**ප්‍රජාමූල බැංකු සමිති ලියාපදිංචි කිරීමේ සහතිකය**

................................................................................................................................ යන ලිපිනය දරන

.................................................................................................................................... සමෘද්ධි

ප්‍රජා මූල බැංකුව 2013 අංක 1 දරන සමෘද්ධි පනතේ, 29 (2)හි විධිවිධාන ප්‍රකාරව

................................................ අංකය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ

ලියාපදිංචි කළ බව මෙයින් සහතික කරමි.

.................................
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

දිනය .................................

03-947/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.